www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයට එරෙහිව මාක්ස්වාදය
The Frankfurt School vs. Marxism,

# ඇලෙක්ස් ස්ටයිනර්ගේ දේශපාලන හා බුද්ධිමය චාරිකාව - තෙවන කොටස

## The political and Intellectual Odyssey of Alex Steiner - Part 3

ඩේවිඩ් නෝර්ත් විසිනි
2008 ඔක්තෝබර් 23

### IIX. ස්ටයිනර් හා විද්‍යාව

සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකත්වය පිලිබඳ ප්‍රශ්නය ස්ටයිනර් යලිත් මඟහැරියේ ය. එනමුදු අප අතර සබඳතා සුහදව පැවතුනි. "මැතිවරන අර්බුදය පිලිබඳ ඔබගේ විශිෂ්ඨ වාර්තාකරනය" සම්බන්ධයෙන් ප්‍රසාදය පලකෙරෙන ඊ.මේල් පනිවිඩයක් ඔහුගෙන් මට ලැබුනි. එම සටහන ඔහු අවසන් කලේ මා නිව් යෝර්ක් නගරයට පැමිනි විට අප අතර හමුවකට කාලය යොදාගත යුතුය යන ආයාචනය ද සමගිනි. ඇත්ත වශයෙන්ම 2001 වසරේ මැයි මස මා නිව් යෝර්ක් නගරයට ගිය ගමනේදී ස්ටයිනර් හමුවූ විටෙක අපි සුහද සාකච්ඡාවක යෙදුනෙමු.

ස්ටයිනර් සිය න්‍යායික දිශානතියෙහි තීරනාත්මක මාරුවකට මැදිවී සිටි බව ප්‍රත්‍යක්ෂ වූයේ ඊලඟ වසර වූ 2002 දී ය. ජර්මනියෙහි කල පෞද්ගලික සංචාරයක දී බර්ලිනයේ පීඑස්ජී සාමාජිකයින්ට දර්ශනය පිලිබඳ දේශනයක් කිරීමට ස්ටයිනර් සිය කැමැත්තෙන්ම ඉදිරිපත් විය. ආගන්තුක සත්කාර සැපයීම මඟහරින්නවුන් ලෙස පෙනී සිටීමට අකැමතිවූ ජර්මානු පක්ෂයේ සහෝදරවරුන් ඔහුට ශ්‍රාවකයන් පිරිසක් ද සැපයූහ. "අපෝහකය හා විද්‍යාවේ අර්බුදය" ඔහුගේ දේශනයෙහි මාතෘකාව විය. **(47)** විද්‍යාවේ ඉතිහාසය ගැන පුලුල් පරාසයක විනාශකාරී සමීක්ෂනයක යෙදුන ස්ටයිනර්, විද්‍යාත්මක ඥානය වර්ධනය කිරීමේදී අනුභූතික පර්යේෂනවල භූමිකාව සම්පූර්නයෙන් බැහැර කිරීමට නොවේ නම් අවම කිරීම අරමුනුකොටගත් බවක් පෙනී ගියේය. ඔහු ප්‍රකාශකර සිටියේ-

> පැරනි පරමානුකවාදීන්ගේ භූමිකාව මෙන් නවීන විද්‍යාවේ උපතෙහි සම්පරීක්ෂන ක්‍රියාවලියකට අයත් තැන, පුරානෝක්ති තත්වයක් ගෙන තිබේ. විද්‍යාත්මක විප්ලවය තුල සම්පරීක්ෂනයෙහි භූමිකාව නියමාකාරයට අවබෝධකර ගැනීමට නම්, කරුනු කාරනා වලින් පුරානෝක්තිය බේරා වෙන්කර ගත යුතුය.

මෙහිදී පලමුවෙන්ම කිව යුත්තේ සම්පරීක්ෂනය හා අවලෝකනය ක්‍රියාත්මක වන්නේ ඓතිහාසික සන්දර්භයක් තුල බවය. අප සොයා යන න්‍යාය හා සංකල්ප මඟින් දැනුවත්වූ සන්දර්භයක් තුල බවය. මේ අර්ථයෙන් අපට කිව හැක්කේ, සියලු සම්පරීක්ෂන හා අවලෝකන ප්‍රථමයෙන්ම "න්‍යායෙන් පිරී ඇති" බවය. මෙය මැසචුසෙට්ස් තාක්ෂනික ආයතනයේ නැසීගිය මහාචාර්ය තෝමස් කුන් විසින් ගොඩනඟන ලද ප්‍රතිවේදයකි. පවත්නා සම්මතය නිගමනය කලේ, සම්පරීක්ෂනය හා අවලෝකනය පූර්වයෙන් පැවති කිසියම් ආකාරයක පුහු තත්වයක් බවත් ඒ මත අප සාමාන්‍යකරනයන් ගොඩනඟන බවත් ය. එම සම්මතයට එරෙහිව මහාචාර්ය කුන් විසින් මේ කරුන පෙන්නුම් කර දීම සම්පූර්නයෙන්ම නිවැරදිය.

නවීන විද්‍යාවේ පාදක මූලධර්මය වශයෙන් "පවිත්‍ර" සම්පරීක්ෂනය හෝ අවලෝකනය පිලිබඳ දේව පුරානය අද දින දක්වාමත් නොනැසී පැවත එන්නකි. එය නූතන අනුභූතිවාදී දර්ශනවාදයේ චර්යාධර්මයකි. එය මම ඉදිරියේදී විස්තර කරමි. බෲනෝ, ගැලිලියෝ හා නිව්ටන් වැනි නූතන විද්‍යාවේ නිර්මාතෘන්, සම්පරීක්ෂන මත පදනම්ව සාමාන්‍යකරනයන් කරා එලඹුනු සම්පරීක්ෂකවරුන් වශයෙන් තමන්ව සලකාගත්තේ නැත. ඔවුන් තමන්ව සලකා ගත්තේ, ස්වභාවධර්මය පාලනය කෙරෙන වීජ ගනිතමය නියාමයන් සොයා ගැනීමට උත්සුක වූ ප්ලතෝනිකවාදීන් ලෙසය.

නිදසුනක් ලෙස සැබවින්ම, සම්පරීක්ෂනය

හා අවලෝකනය ගැලීලියෝගේ නිර්මානයන් තුල භූමිකාවක් ඉටු කලේය. එසේ වුව ද උස කුලුනක සිට බර ද්‍රව්‍ය පහතට හෙලීම වැනි සම්පරීක්ෂන වලින් ගැලීලියෝ අදහස් කලේ තම න්‍යාය තහවුරු කිරීමය. එම සොයාගැනීම ඔහුගේ න්‍යාය සඳහා පදනම නොවීය. තව ද තම තර්කය ඔප්පු කිරීම සඳහා ද්‍රව්‍ය ඉහල සිට පහලට වැටීමට ගතවන කාලය ප්‍රමානවත් නිරවද්‍යතාවකින් යුතුව මැනීමට අවශ්‍ය තාක්ෂනික හැකියාව ගැලීලියෝ සතුව නොපැවති බව ඇතැම් ඉතිහාසඥයන් විසින් පෙන්වාදී තිබේ. ඇත්ත වශයෙන්ම විද්‍යාවේ ඉතිහාසය පුරාවටම දක්නට ලැබෙන්නේ දැවැන්ත සොයාගැනීම්, අනුභූතික දර්ශනවාදය තුල "සම්පරීක්ෂන" ගුරුකුලය විසින් නියම කරන ලදැයි කියනු ලබන මග ගත්තේ කලාතුරකින් බවයි.

විද්‍යාවේ වර්ධනය තුල අවලෝකනයේ හා සම්පරීක්ෂනයේ වැදගත්කම බාල්දු කිරීම සම්බන්ධයෙන් තවත් නිදසුනක් ඉදිරිපත් කරමින් ස්ටයිනර්, අයින්ස්ටයින් පිලිබඳ නිදසුන ගෙනහැර දැක්වීය.

සාපේක්ෂතාවාදය පිලිබඳ ඔහුගේ විශේෂිත න්‍යාය, ප්‍රථමයෙන් අනුභූතිකව තහවුරු වූයේ සම්පරීක්ෂනයක් තුලින් යයි අයින්ස්ටයින් දැනගත් විට, එය සම්පූර්න වශයෙන් ඔහු තෘප්තිමත් කිරීමට සමත් නොවීය. උද්යෝගයකින් තොරව ම ඔහු කියා සිටියේ "එනමුදු එම න්‍යාය නිවැරදි යයි මම දැන සිටියෙමි" යනුවෙනි.

දේශනයට පදනම් කරගත් ලිඛිත රචනය ස්ටයිනර් විසින් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සාමාජිකත්වය අතර බෙදාහරින ලද අවස්ථාවේ, ඒ සම්බන්ධයෙන් බලගතු විරෝධයක් මතු විය. විශේෂයෙන්ම විද්‍යාව පිලිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි ඉහල උපාධි හිමි පක්ෂ සාමාජිකයින්ගෙන් මෙම විරෝධතා එල්ල විය. සිය කුසලතා මට්ටමට වඩා බොහෝ ඔබ්බට ගිය කරුනු වලදී ස්ටයිනර් උද්ධච්ඡ ලෙස අධානග්‍රාහීවූ බව ඔවුහු හඳුනා ගත්හ. විද්‍යාවේ ඉතිහාසය පිලිබඳව පුලුල් පරාසයක පැතිරුනු ඔහුගේ නිගමන තහවුරු කිරීම සඳහා අවශ්‍ය පුහුනුව හා දැනුම ඔහුට නොතිබුනි. විශ්වවිද්‍යාල ගනිතඥයෙකු හා බ්‍රිතාන්‍ය තුල ජාත්‍යන්තර කමිටුවේ දිගු කාලීන සාමාජිකයෙකු වන ක්‍රිස් ටැල්බට් ස්ටයිනර්ට සටහනක් ලියා යැවීය. මිත්‍ර ශීලී හා තරමක් මුදු බසින් ඔහුගේ තර්කයන්ගේ වඩාත් කැපී පෙනෙන දෝෂ කෙරෙහි ටැල්බට් ස්ටයිනර්ගේ අවධානය යොමුකරවීය. නිදසුනක් ලෙස ටැල්බට් ස්ටයිනර්ට මෙසේ අනතුරු ඇඟවීය.

(ඇලෙක්සැන්ඩර්) කොයිරේගේ ප්‍රවේශයට අනුව යමින් යයි මා අනුමාන කරන) බෘනෝ, ගැලීලියෝ අනෙකුත් නූතන විද්‍යාවේ නිර්මාතෘන්, තමන් සලකා ගත්තේ ප්ලතෝනිකවාදීන් ලෙස යයි ඔබ ඉදිරිපත් කරන යෝජනාව ගැඹුරු අධ්‍යාසයකින් ඔප්පු නොවනු ඇතැයි මම අදහස් කරමි. නොයෙක් ආකාරයේ ප්ලතෝනික මත යම් භූමිකාවක් ඉටුකලේම නැතැයි මා කියන්නේ ද නැත. එසේ වෙතත්, කොයිරේගේ ප්‍රවේශය තහවුරු නොකරන ගැලීලියෝ හා විද්‍යාත්මක විප්ලවයට සම්බන්ධ අනෙකුත් යෝධ පුද්ගලයන් පිලිබඳව පසුගිය දශක කිහිපය තුල සිය ගනන් පොත්පත් හා දහස් ගනන් පත්‍රිකා ලියවී ඇත. (1997 වසරේදී මැක්මිලන් විසින් පලකරන ලද ජෝන් හෙන්රිගේ *The Scientific Revolution and the Origins of Modern Science,* (විද්‍යාත්මක විප්ලවය හා නූතන විද්‍යාවේ මූලයන්) නමැති කෘතියෙහි මේ පිලිබඳව සාහිත්‍යමය වටිනාමකින් යුත් බෙහෙවින් ප්‍රයෝජනවත් මඟ පෙන්වීමක් මම දුටුවෙමි)

එම කාල පරිච්ඡේදය තුල අවලෝකනය හා සම්පරීක්ෂනය විසින් ඉටුකරන ලද මුඛ්‍ය භූමිකාව පෙන්වාදීම සඳහා යමෙක්, විද්‍යාත්මක අදහස් නිරතුරුව ම සම්පරීක්ෂන පසුපස ගාටන්නේ යයි තර්ක කරන අනුභූතිවාදියෙකු විය යුතු නැත. ගැලීලියෝට සිය සම්පරීක්ෂන ක්‍රියාවට නැගීමට හැකියාව නොතිබිනැයි යන මතය කෙටි කාලයක් තුල ජනප්‍රිය විය. එසේ වුවත් සෙට්ල්මන් ඩ්‍රේක් විසින් ඉටුකල වැඩ කොටස තුලින් හා සම්පරීක්ෂකවරුන් විසින් මෙම සම්පරීක්ෂන ප්‍රවේසම් සහිතව ප්‍රත්‍යුත්පාදනය කිරීම මඟින් එම මතය නිෂ්ප්‍රභාවී ඇත. (නිදසුනක් වශයෙන් අයි බර්නාඩ් කොහෙන්ගේ *The Birth of a New Physics,* (නව භෞතික විද්‍යාවේ උපත) නම් කෘතියේ සංශෝධිත සංස්කරනය, විශේෂයෙන් එහි අතිරේකය බලන්න.)

තව ද "ස්ටැලින්වාදී කඳවුරෙහි ග්‍රාම්‍ය මාක්ස්වාදයට" මා පැහැදිලිව ම විරුද්ධ වන නමුදු, ඩිමොක්‍රීටස්ගේ හා එපිකියුරස්ගේ බලපෑමෙහි වැදගත්කම ඔබ අඩු තක්සේරු කිරීම මට පිලිගත නොහැක. නිදසුනක් ලෙස 17 වන සියවසෙහි වඩාත්ම බලපෑමක් ඇතිකල පුද්ගලයෙකු වූ පියරි ගැසෙන්ඩිගේ නිර්මාන පදනම් වූයේ එපිකියුරස් කල වැඩ කොටස මතය. තමා ඔවුන්ගේ වැදගත්කම අවතක්සේරු

කල බවට කොයිරේ පවා තමන්ගේ පසුකාලීන ලියවිලි තුලින් පිලිගත්තේය.

ටැල්බට් ඉන්පසු පූර්ව ඥානයෙන් පිරිපුන් අනතුරු ඇඟවීමක් කලේය.

"සම්පරීක්ෂනවාදී" අනුභූතිවාදී ගුරුකුලයට පහරදීමේ අවශ්‍යතාවය මත ඔබ, විද්‍යාවේ වර්ධනය පිලිබඳ මාක්ස්වාදයට මුලුමනින්ම විරුද්ධ ප්‍රවේශයන් නොසලකා හැරීමේ අනතුරුදායක තත්වයට පත්ව ඇතැයි සිතමි. මා සඳහන් කරන්නේ හයිඩෙගර් පිලිබඳව ඔබ පලකල ලිපියෙහි ඔබ ඉතා සාර්ථක ලෙස පහරදෙන නොයෙකුත් පශ්චාත් නූතනවාදී ඉදිරිදර්ශන හා පුලුල් ලෙස පැතිරුනු විද්‍යා විරෝධී මනෝභාවයන් ගැනය.

"ගැලීලියෝ සත්‍ය වශයෙන්ම සිය සම්පරීක්ෂන වල නොයෙදුනේය යන මතය මම සඳහන් කර ඇත්තෙමි. එනමුදු, එම න්‍යාය නිවැරදි බව මම දැන සිටියෙමු"යි අයින්ස්ටයින්ගෙන් උපුටා දැක්වීම තවෙකකි. මෙසේ උපුටා දක්වා ඇත්තේ 1919 වසරේදී අයින්ස්ටයින්ගේ ශිෂ්‍යාවක වූ රොසෙන්තෝල් විසින් හයිඩෙගර් ගැන කල අතීතාවර්ජනයන් ගෙනි. සූර්යා විසින් ආලෝක කිරන නැමීමකට ලක් කරන අතර, එය මැන බැලීම අරමුනු කරගෙන එඩිංටන්, සූර්යග්‍රහන චාරිකාවක යෙදුනේය. ඒ තුලින් සාපේක්ෂතාවාදය තහවුරු කෙරුනු බව අසා දැනගත් විට අයින්ස්ටයින් එයට දැන්වූ ප්‍රතිචාරය මේ උපුටා දැක්වීම තුල අන්තර්ගත වෙයි. මෙය වූ කලී විද්‍යාත්මක ඥානය සම්පූර්නයෙන්ම සාපේක්ෂ බවත්, එය හුදෙක් තවත් එක් "වෘත්තාන්තයක්" පමනක් බවත්, අවලෝකනය හා සම්පරීක්ෂනය තුලින් එය සත්‍යෙක්ෂනය කිරීම, මහා විද්‍යාඥ අයින්ස්ටයින් විසින් විරෝධය දක්වන ලද අනුභූතිවාදී දේවපුරානයක් බවත් ඔප්පු කිරීමට අවශ්‍ය පුද්ගලයින්ගේ ජනප්‍රිය සඳහනකි.

තෝමස් කුන් ගැන ඔබ විසින් කරන ලද පක්ෂග්‍රාහී සඳහනකින් එම ප්‍රශ්නයම පැන නඟියි. සියලු සම්පරීක්ෂන හා අවලෝකන, පලමුකොටම "න්‍යාය හරිත" ඒවාය යන්න පූර්න සාපේක්ෂතාවාදයට සහාය දීමක් ලෙස පහසුවෙන්ම අර්ථකථනය කල හැක. විද්‍යාවේ ඉතිහාසය පිලිබඳව කුන් බැරෑරුම් වැඩ කොටසක් ඉටු කලේය. (*Black Body Radiation and the Quantum Discontinuity,* "(අඳුරු ස්කන්ධයේ විකිරනය හා ක්වොන්ටම් ආසන්තතිය)" යන ඔහුගේ අධ්‍යයනය එවැන්නකි.) විශේෂයෙන්ම "*The Structure of Scientific Revolutions,* (විද්‍යාත්මක විප්ලවයන්ගේ ව්‍යුහය)" නමැති කෘතියේ ඔහුගේ තේමාව වූයේ විප්ලවයේදී න්‍යායන් දෙකම කෙසේවත් සමහන් කල නොහැකි පරිදි එක් විද්‍යාත්මක න්‍යායකින් අනෙක විස්ථාපනය වන බවය. ඔ හු ෙග ් එවැනි දාර්ශනික ලියවිලි විද්‍යාව පිලිබඳ පශ්චාත් නූතනවාදී ප්‍රහාරයන්ගේ කේන්ද්‍රය බවට පත්ව තිබේ. (නිදසුනක් ලෙස ඇලන් සොකාල්ගේ "*Intellectual Impostures,* (බුද්ධිමය වංචනිකත්වය)" බලන්න.)

ටැල්බට්ගේ ලිපියට ස්ටයිනර්ගේ පිලිතුර, ඔහු ඊට යාකර යැවූ පෘතුල විවේචනාත්මක සංකේතයන්ගේ ස්වරූපය ගත්තේය. කරුනු කාරනා ගනනාවක් පිලිගන්නා අතරම එම සටහන් වලින් ඇඟවුම් කලේ, ඔහුගේ අදහස් භෞතිකවාදී ලෝක දෘෂ්ටියකින් තව තවත් ඈත්වෙමින් තිබෙන බවය. මෙය කැපී පෙනෙන ලෙස ප්‍රකාශයට පත්වූයේ විද්‍යාවේ වර්ධනය කෙරෙහි ආගම, ගුඪවාදය හා ඉන්ද්‍රජාලය විසින් ඉටුකරන ලද සැලකිය යුතු දායකත්වය අවබෝධකර ගැනීමට ටැල්බට් අපොහොසත් වීය යන ඔහුගේ කියමන තුලිනි.

> ...එසේ වෙතත් තව ද බලපෑමක් ඇත. - මැත අධ්‍යයනය තෙක් මේ ගැන අවබෝධයක් නොතිබුනි.- මින් මා අදහස් කරන්නේ ආදි රසායන විද්‍යාවාදී සම්ප්‍රදාය හා ඉන්ද්‍රජාලික මතවල බලපෑමය. මහා පුරෝගාමීන් ප්‍රානවත් කල ගුඪවාදී මූලයන් සම්බන්ධ සාකච්ඡාවකින් තොරව, 17 වන සියවසේ විද්‍යාවෙහි උපත පිලිබඳ වෘත්තාන්තය අසම්පූර්න ය. බෲනෝ සම්බන්ධයෙන් ගත්කල, ෆ්‍රාන්සස් යේට්ස් විසින් රචිත "ගියෝර්ඩානෝ බෲනෝ හා ආදි රසායන විද්‍යාවාදී සම්ප්‍රදාය" *Giordano Bruno and the Hermetic Tradition*, යන කෘතිය නවීන විද්‍යාව මත ආදි රසායන විද්‍යාවාදී සම්ප්‍රදායෙහි බලපෑම සාකච්ඡා කරන විශිෂ්ඨ ග්‍රන්ථයකි. ඃSIC-එය එසේමය*

යේට්ස්ගේ කෘතීන් කෙරෙහි ස්ටයිනර්ගේ ආකර්ශනය වැදගත්ය. මන්දයත් විද්‍යාත්මක හා ආගමික ලෝක දෘෂ්ටීන් අතර විසංවාදය කෙරෙහි අවධානය යොමුකල විද්‍යාත්මක විප්ලවය පිලිබඳ අර්ථ කථන අපකීර්තියට පත්කිරීමේ උත්සාහයේදී, යේට්ස් එහි පෙරමුනේම සිටි තැනැත්තියක් වීම නිසාය. චින්තනයේ ඉස්මතුවීම කෙරෙහි ආගම හා ගුප්ත බලවේග ප්‍රධාන ආවේශයක් සම්පාදනය කලේය යන්න පැහැදිලි කිරීම සඳහා ෆ්‍රාන්සස් යේට්ස් (1899-1981) ඇගේ ශාස්ත්‍රාලිකයේ දශක ගනනාවක්ම ගතකලාය. බෲනෝගේ කෘතීන් තුල ඇති භෞතිකවාදී ස්වරය නිහඬ කිරීම අරමුනුකොට ගත් යේට්ස්, සිය ප්‍රවාදය

තුල තර්ක කලේ, ඔහුගේම අවධිය තුල විද්‍යාත්මක සොයාගැනීම් පිලිබඳව පැවති බෘනෝගේ උනන්දුව කලින් යුගයක ඉන්ද්‍රජාලීය දර්ශනය මත රැඳී පැවති බවට හා එය අහඹුවක් බවටත් ය. බෘනෝ කොපර්නිකස්ට අවනත වීමේ මූලයන් විද්‍යාත්මක ඒවා නොව ආගමික වූ බව ඇය කියා සිටියා ය. එමනිසා බෘනෝගේ ඝාතනය අවබෝධ කරගත යුත්තේ දාර්ශනික හා විද්‍යාත්මක අභියෝගයක ප්‍රතිචාරයක් ලෙස නොව, ඒ වෙනුවට ආදි රසායන විද්‍යාවාදය සමඟ බෘනෝට පැවති සම්බන්ධයට එරෙහි (විමර්ශනයෙන් මතුකරගත්) ආගමික මිත්‍යාග්‍රාහයක (විපරමෙන් සිට දඬුවම් පැමිනවීමේ කතෝලික පල්ලිය විසින් සංවිධානය කල) එක්තරා ස්වරූපයක් ලෙසය. **(48)** යේට්ස් සිත්ගන්නා සුලු ආරකින් ලිව්වාය. එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය තුල ඇගේ කෘති බෘනෝගේ ශාස්ත්‍රෝද්ග්‍රහනය මත වෙසෙසි බලපෑමක් ඇති කලේය. එනමුත් ඇගේ කෘති තියුනු විවේචනයට ද ලක් විය. **(49)** තව ද ආදි රසායනය මත සිය කේන්ද්‍රීය අවධාරනය යෙදූ අයිසැක් නිව්ටන්ගේ කෘතීන් පිලිබඳ අර්ථ කථනයක් ස්ටයිනර් වැලඳ ගත්තේය.

ඉන්ද්‍රජාලය හා ආදි රසායනය පිලිබඳ බෘනෝගේ උනන්දුවෙහි වැදගත්කම ඉතිහාසඥයන් විසින් ලුහු කොට දැක්වුව ද, ඒ සම්බන්ධ වැටහීමක් සියවස් ගනනාවක් තුලම පැවතුනි. ගුප්ත විද්‍යා, ඉන්ද්‍රජාලය හා අනෙකුත් කටයුතු පිලිබඳව නිව්ටන්ගේ උනන්දුව ගැන නම් මෑතක් වන තෙක්ම අවබෝධයක් නොතිබුනි. *ඔයැ ඡ්ඹ් ඡ්ජි දශ ඡ්ැබසම්* (ජේනස් ෆේසස් ඔෆ් ජීනියස්) හා අනෙකුත් කෘතීන් තුලින් නිව්ටන් පිලිබඳ අපගේ අවබෝධය වෙනස් කිරීමට බෙටී ජේ ඩොබ්ස් **(50)** විශාල වැඩ කොටසක් ඉටුකර ඇත. භෞතික විද්‍යාවට වඩා ආදි රසායනය පිලිබඳ සම්පරීක්ෂන වලට නිව්ටන් සිය කාලය යෙදවූ බවත් සිය භෞතික විද්‍යාව ඔහු විසින් පරිකල්පනය කරන ලද්දේ, සිය ගූඪවාදී ආගමික විශ්වාසයන්වල ප්‍රකාශනයක් වශයෙනැයි ද දැන් පෙනී යයි. ආදී රසායනය පිලිබඳව නිව්ටන් දැක්වූ උනන්දුව ඔහුගේ විද්‍යාත්මක ව්‍යායාමයන්ට අදාලවී ද යන්න ගැන, ඩොබ්ස් හා ඔබ (ටැල්බට්) සඳහන් කල ඉතිහාසඥයා වන අයි බර්නාඩ් කොහෙන් අතර, දිගින් දිගටම මතභේද පැවති බව මට හැඟේ. මෙවැනි මතභේදයක් විනිශ්චය කල හැක්කේ නිව්ටෝනියානු විද්‍යාව කෙසේ වර්ධනය වුනි ද යන්න සම්බන්ධයෙන් ප්‍රාග්-අනුභූතික මතියක් මත පදනම් වී නොව, ඓතිහාසික සාක්ෂි මත පදනම් වීම තුලිනි. දිගින් දිගටම පැවතෙන මෙම මතභේදය සම්බන්ධයෙන් විනිශ්චයක් දීමට මා අදහස් නොකරන අතර, ඩොබ්ස් ඉදිරිපත් කරන සිද්ධාන්තය කුතුහලය දනවන්නක් බව ද එය එකහෙලාම බැහැර කල නොහැක්කක් බව ද මම අදහස් කරමි.

තව ද මීට පෙර ස්ටයිනර් යේට්ස් කෙරේ මන බැඳුනු අවස්ථාවේදී මෙන්ම මෙවර ද ඔහු යේට්ස්ගේ සිද්ධාන්තය එතරම් "කුතුහලය දනවන්නක්" සේ සැලකුවේ මන් දැයි කෙනෙකු අනිවාර්යයෙන්ම කල්පනා කරනු ඇත. යේට්ස්ගේ කෘතීන් කෙරෙහි කිසිසේත්ම විරුද්ධත්වය නොපාන විශ්ලේෂකයෙක් ප්‍රකාශ කර සිටියේ, "ඩොබ්ස්ගේ වෑයමෙහි සමස්ත ප්‍රතිපලය වන්නේ, පුලුල් වශයෙන් නිව්ටන්ගේ විද්‍යාවෙහි ආගමික අර්ථ කථනයක් තුල ලැගුම් ගත් ඔහුගේ ආදි රසායනය පිලිබඳව, ඇය දැන් ආගමික අර්ථ කථනයක් ඉදිරිපත් කරන්නේය යන්නයි." **(51)** ඇගේ ප්‍රති අර්ථ කථනය ස්ටයිනර්ගේ මතකයට නැගුනේ කුමක් නිසා ද? ඩොබ්ස් හා අයි බර්නාඩ් කොහෙන් අතර මතභේදය තුල, ස්ටයිනර්ගේ අනුකම්පාව රැඳී පවතින්නේ කොතැනදැයි යන්න ගැන සැබවින්ම ප්‍රශ්නයක් පැන නොනඟියි. ස්ටයිනර් වනාහි, න්‍යාය අනුභූතික සත්‍යේක්ෂනය මත කුමන ආකාරයකින් හෝ රඳපවතින්නේය යන්න මහත් පිලිකුලෙන් යුතුව බැහැර කරන කෙනෙකි. එවන් ස්ටයිනර් කෙනෙක්, නිව්ටෝනියානු භෞතික විද්‍යාවේ වර්ධනය තුල ආදි රසායනයේ භූමිකාව පිලිබඳ ගැටලුව "විනිශ්චය කල හැක්කේ නිව්ටෝනියානු විද්‍යාව කෙසේ වර්ධනය වුනේ ද යන්න සම්බන්ධයෙන් ප්‍රාග්-අනුභූතික මතියක් මත පදනම්වී නොව, ඓතිහාසික සාක්ෂි මත පදනම්වීමෙන් යයි" ටැල්බට් වෙත දන්වා සිටීම කුතුහලය දනවයි. ඇත්ත වශයෙන්ම නම්, ස්ටයිනර් ඓතිහාසික සාක්ෂි නොසලකා හරින්නෙකි. ඉන් ඔබ්බට, ආගම හා විද්‍යාව අතර සම්බන්ධය පිලිබඳ ගැටලුව, එයට පාදක වූ ප්‍රශ්න සම්බන්ධයෙන් දාර්ශනික වශයෙන් සවිඥානක අන්තර් දෘෂ්ටියක් නිශ්චිතව ම අවශ්‍ය කරවන ආකාරයේ ගැටලුවකි. ප්‍රාග් ප්‍රබුද්ධත්වයේ ඉන්ද්‍රජාලීය සම්ප්‍රදාය හා විද්‍යාව අතර සම්බන්ධය සාපේක්ෂකරනයට ලක් කිරීම සඳහා (යේට්ස් අපේක්ෂා කල ආකාරයට) ප්‍රයත්නයන්ගේ හේතුවාද-විරෝධී ගම්‍යයන් ආදි රසායනය හා රස විද්‍යාව අතර විවාදයට සම්බන්ධ විචාරකයන් විසින් හොඳින් අවබෝධ කරගෙන ඇත. **(52)**

තවද, ආදි රසායනය හා විද්‍යාව අතර සම්බන්ධය පිලිබඳ ප්‍රශ්නය සලකා බැලීමේදී, ආදි රසායනය කෙරෙහි නිව්ටන්ගේ පෞද්ගලික උනන්දුව, දෙවියන් ගැන ඔහුගේ දැඩි විශ්වාසය ගැන සඳහන් නොකලත්, නිශ්චිතව ම ගත්තේ ද්විතීයික වැදගත් කමකි. නිව්ටන් වනාහි තමා ජීවත්වූ කාලයේ මිනිසෙකි. බෘනො ද එවැනි අයෙකි. පුද්ගලයන් වශයෙන් මේ දෙදෙනාටම සරල ලෙස තමන් ජීවත්වූ පරිසරයෙන්

පිට පැනීමට නොහැකි විය. අතීතයෙන් උරුමකර දෙන ලද සංකල්ප හා චින්තන මාධ්‍ය සිය අවධීන්හි ප්‍රබලතම මනස්වලට පවා දැවැන්ත බලපෑමක් ඇති කලේය. එසේ වුවත් අවසාන විග්‍රහයේදී රසායන විද්‍යාව වර්ධනය කිරීම සඳහා එය ආදි රසායනයෙන් මුදා ගැනීම අවශ්‍යවූවාක් සේම, විද්‍යාවේ හා එයට අදාල වූ ක්‍රමවේදයේ විස්තාරනයකට, ආගමික ලෝක දෘෂ්ටියකින් බිඳීයාම අවශ්‍ය විය. කුමන හෝ විද්‍යාඥයෙකුගේ බුද්ධිමය වර්ධනය තුල විසංවාදයන් තිබියදී වුවත්, විද්‍යාව හා ආගම් අතර අතිමූලික හා නොපෑහෙන ප්‍රතිවාදය එලෙසම තහවුරු විය - පුද්ගලයන් තුල එසේ වූයේ බොහෝවිට අර්ධ වශයෙන් හා නොපැහැදිලි ලෙස වුවත් ඓතිහාසික ක්‍රියාවලිය තුල එසේ සිදුවූයේ පූර්න වශයෙන් හා නොපෑහිය හැකි ආකාරයකට ය. **(53)**

මිත්‍යා ලබ්ධිකයෙක්ය යන චෝදනාව මත බෲනෝ මරා දැමීම තුල ආදි රසායන විද්‍යාවාදය ඉටුකල භූමිකාව හා නිව්ටන්ගේ භෞතික විද්‍යාව තුල රස විද්‍යාව ඉටුකල ක්‍රියාකලාපය මූලික ගැටලුවක් ලෙස ඉස්මතුවීම පුදුමයට හේතුවන කරුනක් සේ පෙනී යන්නට පුලුවන. එහෙත් තමන්ගේම න්‍යායික හා දේශපාලනික විකාශනය පිලිබඳව සැලකිය යුතු අවබෝධයක් ඇති කරන ප්‍රමානයට, විද්‍යාවේ ඉතිහාසය වෙත ස්ටයිනර්ගේ ප්‍රවේශය අරභයා මෙහිදී යොමුකරන ලද අවධානය යුක්තිසහගතය. ඔහුගේ බුද්ධිමය සංකල්පයන්හි ප්‍රගමනය හෝ අපගමනය සොයා යාමේදී අප කරන්නේ ජත්‍යන්තර කමිටුවට නොහික්මුනු ලෙස පහර ගැසීමට පෙරාතුව, ස්ටයිනර් විසින් කල යුතුව තිබුනු දෙය මය. ඩොබ්ස්ගේ හා යේට්ස්ගේ තර්ක, ආගම හා ගූඪවාදයට ප්‍රගතිශීලී භූමිකාවක් ආරූඪ කල අතර, විද්‍යාවේ ඉතිහාසය තුල අහේතුකයට වැදගත් තැනක් අත්කර දුන් ඉතිහාසය කියවීමක් යුක්තිසහගත කලේය. මේ තර්කයන් වෙත ස්ටයිනර්ගේ ආකර්ශනය පෙන්නුම් කලේ, ඉතිහාසයේම වර්ධනය හා සවිඥානකත්වය කෙරේ භෞතිකවාදී අවබෝධයකට ඔහු තුල කලින් තිබූ කැපවීමෙහි ශේෂව තිබූ කොටස් ද ඔහු වේගයෙන් ඉවත ලමින් සිටි බවයි. විද්‍යාවේ වර්ධනය කෙරෙහි ආදි රසායන විද්‍යවාදයේ හා රස විද්‍යාවේ දායකත්වය අරභයා ඔහු අලුතින් දැක්වූ උද්යෝගය හා සමාජවාදී සවිඥානකත්වයේ වර්ධනය කෙරේ මනෝරාජික දේවපුරානයන්ට තීරනාත්මක භූමිකාවක් ඉටුකල හැකිය යන තර්කයට ඔහු තුල ඉස්මතුවීගෙන එන කැපවීම අතර, පැහැදිලි සම්බන්ධයක් තිබුනි. විද්‍යාවෙන්, වෛෂයිකත්වයෙන්, බුද්ධිවාදයෙන්, භෞතිකවාදයෙන් හා මාක්ස්වාදයෙන් පසුබැසීමක් මේ අවස්ථා දෙකෙහිදීම දක්නට හැකිය. **(54)**

මේ සන්දර්භය තුල, නූතන විද්‍යාවේ සම්භවයන් ගැන සාකච්ඡා කිරීමේදී 16 හා 17 වන සියවස්හි විද්‍යාවේ වර්ධනයෙහිලා තීරනාත්මක සාධකය වූයේ, චින්තනයේ නිදහස් වර්ධනය නොව - එහි වඩාත් ගූඪවාදී හා ගුප්ත ස්වරූපයන් ද නොවන බව කිව යුතු අතර - ඒ වෙනුවට නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය යයි එංගල්ස් කල අවධාරනය ස්ටයිනර් විසින් නොසලකා හැරීම විශේෂයෙන් සලකා බැලිය යුත්තකි. **(55)** විද්‍යාව ඉස්මතු වීමේ නිෂ්පාදන හා ආර්ථික පදනම යේට්ස් විසින් නිශ්චිතව ම ප්‍රතික්ෂේප කරන ලදී. යේට්ස් ඉදිරිපත් කලේ මේ ක්‍රියාවලියෙහි විවෘත පරමාදර්ශවාදී පැහැදිලි කිරීමකි. **(56)**

එංගල්ස්ගේ අවශ්‍යම පාඨය ස්ටයිනර් විසින් නොසලකා හැරීම හුදු අතපසුවීමක් නොවේ. යේට්ස්ගේ පරමාදර්ශී ප්‍රවාදයට ඔහුගේ ආකර්ෂනය නිරූපනය කලේ, එංගල්ස් විසින් පිලිගන්නා ලද භෞතික දැක්මෙන් ඔහුගේ සංකල්ප තව දුරටත් දුරස්ථ වීමයි. ටැල්බට් වෙත ඔහු යැවූ පිලිතුරෙහි පසුව එන කොටසක, 1999 වසරේදී තමා විසින් එංගල්ස් පිලිබඳව කරන ලද විවේචනය නැවත ඉදිරිපත් කරයි.

> එංගල්ස්ගේ ඉහල මට්ටමේ සම්පින්ඩනයන් පරෙස්සමින් භාවිතා කල යුතු බව මම හැම විටම සිහියට නගා ගත්තෙමි. ඉතා ඉහල මට්ටමක දී ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීමක දී එංගල්ස්ගේ සූත්‍රගත කිරීම් ප්‍රයෝජනවත් වන්නට පුලුවන. එසේ වුව ද ගැටලුව වී ඇත්තේ එංගල්ස්ගේ ප්‍රකාශන වැරදියට භාවිතා කිරීමයි. එංගල්ස්ගේ වරදකින් නොවූව ද ඔහුගේ ප්‍රකාශන, විශේෂයෙන්ම ස්ටැලින්වාදීන් විසින් වැරදියට භාවිතාකර ඇත්තේ දර්ශනවාදයේ ඉතිහාසය පිලිබඳව මුලුමනින්ම ව්‍යාජ චිත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා ය. දර්ශනවාදයේ මුලු මහත් ඉතිහාසය ම පිරික්සා ඇත්තේ ප්‍රශ්නයට තුඩුදුන් එකම කාරනය පරමාදර්ශවාදයට එරෙහිව භෞතිකවාදය වූවාක් සේය. පලමුව, දර්ශනවාදයේ ඉතිහාසය තුල මතභේදයට ලක්වූ වෙනත් බොහෝ තීරනාත්මක ගැටලු තිබුනේය යන්නත්, මේ ගැටලු භෞතිකවාදයට එරෙහිව විඥානවාදී සුසමාදර්ශයට ලඝු කිරීමට නොහැකිය යන්නත්, මේ මගින් නොසලකා හැර තිබේ.

මෙය, දර්ශනවාදයේ වර්ධනය පිලිබඳ මාක්ස්වාදී සංකල්පය විකෘති කිරීමකි. දර්ශනවාදයේ ඉතිහාසය තුල "ප්‍රශ්නයට බඳුන්වූ එකම කරුන" භෞතිකවාදය හා පරමාදර්ශය අතර සම්බන්ධතාවය යයි කිසිදු මාක්ස්වාදියෙකු ප්‍රකාශ කොට නැත. එය පැහැදිලිව ම ව්‍යාජ ප්‍රකාශයක් වනු ඇත. එය මූලික ප්‍රස්තුතය යයි එංගල්ස් දිගටම කියා සිටියේ මුලුමනින්ම වෙනස්වූ කාරනයක් මතය. පසුගිය වසර 2500 තුල දාර්ශනිකයන් පුලුල් පරාසයක ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කොට ඇත. ස්ටයිනර් විසින් පෙන්නුම් කරන

ලද පරිදි ඒවාට "එක" හා "බොහෝ" යන්න අතරත්, ස්වච්ඡන්දයට එරෙහිව නියතිවාදය යන්න අතරත් ඇති සම්බන්ධතාවන් ද ඇතුලත් ය. වඩාත් පසුකාලීන අවධියකට අයත් වෙනත් ප්‍රශ්නයක් අපි සලකා බලමු. නූතන මිනිසාගේ අවධානයට යෝග්‍ය එකම ගැටලුව සියදිවි හානිකර ගැනීම පිලිබඳ ප්‍රශ්නය, එනම් ජීවත්වීමෙහි වැදගත්කමක් ඇද්ද යන ප්‍රශ්නය බව අස්තිත්වවාදී දාර්ශනිකයෙකු වන ඇල්බට් කැමූ 'සිසිෆස්ගේ දේවපුරාණය' හෙවත් *Myth of Sisyphu* (මිත් ඔෆ් සිසිෆස්) යන කෘතිය තුලින් කියා සිටියේය. අස්තිත්වවාදයට අනුව මෙම ගැටලුව, සත්තාව හා විඥානය අතර ගැටලුව අභිබවා ගිය එකකි. එසේ වුව ද සදාචාරය හා ආචාර ධර්මය හා සම්බන්ධ ගැටලු ද ඇතුලුව මෙය හා අනෙකුත් නිර්නායක ගැටලු පිරික්සා බැලීමේදී, විශ්ලේෂනයේ අති මූලික මට්ටමෙහිදී අනන්‍ය ලෙස මඟ පාදන්නේ, එක්කෝ භෞතිකවාදී නැතහොත් විඥානවාදී ස්වභාවයකින් යුත් පිලිතුරු වෙතය.

දර්ශනවාදය පිලිබඳ මූලික ප්‍රශ්නයේදී එංගල්ස්ගේ නිර්වචනය තමා විසින් ප්‍රතික්ෂේප කිරීමේ ස්ථාවරය ආරක්ෂාකර ගනිමින්, මාක්ස්වාදය "ගුනාත්මකව විෂමජාතික දර්ශනවාදයක්" යයි ද ඒ තුල භෞතිකවාදී හා විඥානවාදී නැඹුරුවීම් දෙකම සංයෝජනයවී ඇතැයි ද ස්ටයිනර් තර්ක කලේය.

> අවසානයේදී විද්‍යාව සමග එකට බැඳුනු දර්ශනවාදයේ වර්ධනය මඟ පෙන්වන්නේ, අතිමූලිකවූ භෞතිකවාදී දැක්මක් වෙතය. එනමුදු විඥානවාදී හා භෞතිකවාදී මෙන්ම, ඒ අතර විවිධ පැහැයන් ගත් කලින් පැවති සියලුම දර්ශනවාදයන් තුල ඇති සාරවත් බව, එම දැක්ම තුල අඩංගුවේ. හේගල් ප්‍රකාශකල ආකාරයට සත්‍ය වූ කලී සමස්තය නම් අපට වෙනත් නිගමනයකට පැමිනිය නොහැක.

දර්ශනවාදයේ ඉතිහාසය පිලිබඳ මෙම තක්සේරුව සාරභූත වශයෙන් ම මාක්ස්වාදයට විරුද්ධ වූවකි. එංගල්ස් සිය ලුඩ්විග් ෆොයබාක් කෘතිය තුලින් කලාක් මෙන්, ඓතිහාසික සන්දර්භය කෙරේ ඉතා ප්‍රවේශම් සහගත අවධානයකින් යුතුව මාක්ස්වාදයේ වර්ධනය අරභයා, විඥානවාදී දර්ශනවාදයේ ඇතැම් ආකෘතීන් මඟින් පෙන්නුම් කරන ලද දායකත්වය - විශේෂයෙන් සම්භාව්‍ය ජර්මානු විඥානවාදී ගුරු කුලය - පැහැදිලි කිරීම එකකි. මෙහිදී ස්ටයිනර් කරන්නාක් මෙන් මාක්ස්වාදය විෂමජාතික ලෝක දැක්මක් යයි ද එය තුල විඥානවාදය මෙන්ම භෞතිකවාදය ද යම්කිසි අපැහැදිලි ආකාරකින් සංයෝජනය වී ඇතැයි යෝජනා කිරීම ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. ඔහු යොදාගන්නා වාක්‍ය ඛන්ඩය - "විඥානවාදී හා භෞතිකවාදී මෙන්ම ඒ අතර විවිධ පැහැයන් ගත් කලින් පැවති දර්ශනවාදයන් (මින් ඉඟි කරන්නේ සංශයවාදයට ද? නැතිනම් අඥෙයවාදයට ද?) තුල ඇති සාරවත් බව (එම දැක්ම තුල) අඩංගුවේ" - යන්න වැදගැම්මකට නැති ප්‍රලාපයකි. එය භෞතිකවාදය හා විඥානවාදය මකා දමන්නේ නැත්නම් මඩ කරයි. **(57)**

ඊලඟට ස්ටයිනර් සිය පශ්චාත් නූතනවාදයට එරෙහි අරගලය පිලිබඳ කලින් ලියවිලිවල කරන ලද අවධාරනයෙන් සෑහෙන තරම් දුරකට ඉවතට ඇදී යයි. ඔහු (ස්ටයිනර්) පශ්චාත් නූතනවාදයට අනුගත වන බවට ටැල්බට් විසින් කරන ලද විවේචනයට පිලිතුරු දෙමින් ස්ටයිනර් මෙසේ ප්‍රකාශ කරයි.

> පශ්චාත් නූතනවාදය අද දින අනුභූතිවාදයට හා යථානුභූතිවාදයට වඩා විශාල තර්ජනයක් එල්ල කරන්නේ යයි ඔබ තවදුරටත් කියා සිටී නම් ඔබ කරුනු වශයෙන් හා ඓතිහාසිකව සාවද්‍ය යයි මම සිතමි.

සම්ප්‍රදායානුකූලව ස්ටයිනර් අනුභූතිවාදය හෙලා දුටුව ද පශ්චාත් නූතනවාදය විසින් එල්ල කරන ලද බුද්ධිමය ගැටලුව ඔහු විසින් ලඝු කොට සැලකීම පදනම් වූයේ, කයෝර අනුභූතික හා ප්‍රයෝජ්‍යතා සංචින්තනයන් මත වීම උත්ප්‍රාසාත්මකය. තමන්ගේ දල හා කෝකටත් සරිලන ගනනය කිරීම් මත විශ්වාසය තබමින්, අනුභූතිවාදීන් සංඛ්‍යාව පශ්චාත් නූතනවාදීන් සංඛ්‍යාවට වඩා වැඩි යයි ස්ටයිනර් තර්ක කලේය.

> වර්තමාන බුද්ධිමය ප්‍රවනතා පිලිබඳ ආරම්භක අවබෝධයක් ලබා ගැනීම සඳහා අද දින විශ්වවිද්‍යාල වල තත්වය ගැන සමීක්ෂනයක යෙදීම අප හට ආධාරකයක් වනු ඇත. විශේෂයෙන්ම උතුරු ඇමරිකාවේ හා බ්‍රිතාන්‍යයේ දර්ශනවාදී දෙපාර්තමේන්තු මත විශ්ලේෂනීය දර්ශනවාදයේ හා යථානුභූතිවාදයේ ආධිපත්‍යය හොඳින්ම පැලපදියම්වී ඇත. සංස්කෘතික සාපේක්ෂතාවාදයේ මුල් බැසගත් ජනවාර්ගික අධ්‍යයනයන් ද සංස්කෘතික අධ්‍යයනයන්හි හා වෙනත් විෂයන්හි ප්‍රාගුන්‍යත් සමග පශ්චාත් නූතනවාදීන්, ඇතැම් සාහිත්‍ය දෙපාර්තමේන්තු අත්පත් කරගෙන ඇති බව සැබෑය. එනමුදු මානව ශාස්ත්‍ර අධ්‍යයනයන්ගෙන් විශාල ප්‍රමානයක් යථානුභූතිවාදී හා අනුභූතිවාදී කඳවුරෙහි නිශ්චිතව ම ස්ථානගතවී තිබේ.

මේ ආකාරයේ ගනනය කිරීම් වල පදනම මත දාර්ශනික ප්‍රවනතාවන්හි වැදගත්කම නිවැරදිව තක්සේරු කල නොහැක. අනුභූතිවාදීන් හෝ පශ්චාත් නූතනවාදීන් මහඇදුරු පදවි වැඩි ගනනක් හොබවන්නේ ද යන්න තීරනාත්මක ප්‍රශ්නය නොවේ. වඩාත් වැදගත් වන්නේ පශ්චාත් නූතන චින්තාවේ වෛෂයික හරය - එනම්, සාරභූත දාර්ශනික ගැටලුවලට එය දක්වන ප්‍රතිචාරය - හා සමකාලීන

අවධියේ ගැටලුවලට එහි ඇති සම්බන්ධතාවයි. තත්කාර්යවාදය ද ඇතුලුව ධනේශ්වර චින්තනයේ විවිධ ප්‍රතිගාමී ප්‍රවනතාවන්ගෙන් සාරසංග්‍රහවාදී ලෙස උකහාගත් පශ්චාත් නූතනවාදය මතුවී ඇත්තේ, මාක්ස්වාදයේ වඩාත් සාරභූත ප්‍රස්තුතයන්ට - අන් සියල්ලටමත් වඩා, ඥානනයේ වෛෂයිකත්වයට හා වෛෂයික සත්‍යය පිලිබඳ සංකල්පයට - පහරදීම තුලින් විශාල වශයෙන් මාක්ස්වාදය විනාශ කිරීමේ ප්‍රයත්නයක් වශයෙනි. පශ්චාත් නූතනවාදය සම්ප්‍රදායික සංශයවාදයෙන් ඔබ්බට යයි. එය සත්‍ය අවබෝධකර ගැනීමේ හැකියාව ප්‍රශ්නයට බඳුන්කර ප්‍රතික්ෂේප කරනවා පමනක් නොව, පශ්චාත් නූතනවාදී චින්තාව, වෛෂයික සත්‍යය අපේක්ෂා කරන සියලු බුද්ධිමය ව්‍යාපෘතීන් හෙලා දකියි, පරිහාසයට ලක් කරයි. මේ පදනම මත, බුද්ධිමය පරිසරය තුල, අසීමිත නරුමත්වයක් හා අපේක්ෂා භංගයෙන් පිරි දෘෂ්ටියක් කාවැද්දීමට එය යම් දුරකට සාර්ථක උත්සාහයක් දරා ඇත. **(58)** පශ්චාත් නූතනවාදය වාම හා නව මාක්ස්වාදී චින්තනයේ පවා උප වර්ගයක් ලෙස පුලුල්ව අනන්‍ය වීමේ හේතුවෙන්, මේ ප්‍රතිගාමී බුද්ධිමය ව්‍යවසාය තුල (ස්ටැලින්වාදීන් හා ට්‍රොට්ස්කිවාදීන් ලෙස කලින් පෙනීසිටි අය ද ඇතුලුව) හිටපු රැඩිකල් වාදීන් විශාල සංඛ්‍යාවකගේ සහභාගිත්වය, එහි විනාශකාරී බලපෑම කෙරේ දායකවී ඇත.

## X. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය හා "නව වම" වෙත ස්ටයිනර්ගේ පුනරාගමනය

... ජාත්‍යන්තර කමිටුවට එරෙහිව සිය ප්‍රහාරය දියත් කල යුත්තේ කුමන සංකල්පයන් මත ද යන්න ස්ටයිනර් සිය මනස තුල අඩු වැඩි වශයෙන් සකස්කරගෙන තිබූ බව මේ වන විට පැහැදිලිව තිබේ. සිය දාර්ශනික ආස්ථානයන් තුල ඔහු විසින් ඇතිකරගත් මාරුව හා එක් වූයේ, නව දේශපාලන න්‍යාය පත්‍රයක වර්ධනයයි. එනම් යම්තාක් දුරකට, වඩා නිශ්චිතව ප්‍රකාශ කරන්නේ නම්, 1970 වසරේදී ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට සම්බන්ධ වූ විට ප්‍රතික්ෂේප කරන ලද පැරනි දේශපාලන න්‍යායපත්‍රය යලි පිලිගැනීමයි. මාක්ස්වාදයේ න්‍යායික උරුමයට ඔහුගේ කැපවීමෙන් ශේෂවී තිබුනු දෙයකින් තමාව මුදාගත් ස්ටයිනර්, තමන්ගේම බුද්ධිමය ජීවන චරිතාපදානයෙන්, පසු පියවර තැබීම ආරම්භ කලේය. මේ ආපස්සට ගමන්කිරීමේ තර්කශාස්ත්‍රයෙහි ප්‍රකාශනය අත්කර ගත්තේ, ඔහු මනෝරාජිකවාදය වැලඳගැනීම, මාර්කියුස් හා ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලයට අයත් අනෙකුත් නිවැසියන් යලි ගවේෂනය කිරීම හා ෆ්‍රැන්ක් බ්‍රෙනර් සමඟ දේශපාලන හවුලක ආරම්භය තුලිනි. **(59)**

ස්ටයිනර්-බ්‍රෙනර් ගේ ලියවිලි තුල මනෝරජිකවාදය සැලකිල්ලට ගෙන ඇති අන්දම ගැන මගේ *Marxism, History & Socialist Consciousn* *(මාක්ස්වාදය, ඉතිහාසය හා සමාජවාදී විඥානය)* නමැති කෘතියෙහි දීර්ග ලෙස සාකච්ඡා කර ඇත්තෙමි. **(60)** එසේ වෙතත් ස්ටයිනර්ගේ දේශපාලන විකාශනය පිලිබඳ මේ සමාලෝචනය සම්පූර්න කිරීම සඳහා මෙම ප්‍රශ්නය පිලිබඳ සාකච්ඡාවේදී, ඔහුගේ ආරම්භක මැදිහත්වීම පිරික්සා බැලීම අවශ්‍යවේ. 2002 වසරේදී මනෝරාජිකවාදය පිලිබඳ ප්‍රශ්නය මත ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් නික් බීම්ස් හා බ්‍රෙනර් අතර ලිපි හුවමාරුවක් ඇතිවිය. බ්‍රෙනර් මනෝරාජිකවාදය වැලඳ ගැනීම පිලිබඳව සහාය පලකරන ලිපියක් ස්ටයිනර් විසින් ජර්මනියේ පීඑස්ජී පක්ෂයේ ප්‍රමුඛ සාමාජිකයෙකු වන ස්ටීව් ලෝං වෙත ලියා යැවීය. මාක්ස්වාදය හා විද්‍යාත්මක සමාජවාදය අතර බීම්ස් විසින් පෙන්නුම් කරන ලද ප්‍රභේදය ආරක්ෂා කරමින්, 2002 දෙසැම්බර් 30 දින ලෝං ස්ටයිනර්ට පිලිතුරු යැවීය.

ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ යුද්ධයට විරෝධය පාමින් සමාජවාදී සමානතා පක්ෂය විසින් 2003 මාර්තු 30 වන දින සංවිධානය කරන ලද ජාතික සම්මේලනයට ස්ටයිනර් සහභාගී විය. මගේ ආරම්භක වාර්තාවේ ඉදිරිදර්ශනයට සහාය පලකරමින් එම රැස්වීමේදී ඔහු කථා කලේය. සසපයේ ප්‍රතිපත්ති හා වැඩ කටයුතු සමඟ එකඟ නොවන බවක් ඔහු ඉඟිකලේ නැත. ඉන් මාස දෙකකට පසුව 2003 මැයි 28 වන දින ලෝං වෙත ස්ටයිනර් දීර්ඝ ලිපියක් යැවීය. මාක්ස්වාදී න්‍යායික හා බුද්ධිමය සම්ප්‍රදායක් ලෙස යාන්තමින් හෝ හැඳින්විය හැකි යමක් තුල ස්ටයිනර් තවදුරටත් ක්‍රියානොකරන බව එම ලිපියෙන් පැහැදිලි විය.

මාක්ස්වාදයේ ඉස්මතුවීම නිරූපනය කලේ, මනෝරාජික සමාජවාදයෙන් බිඳීමක් නොව එය දිගටම පවත්වාගෙන යාමක්ය යන්න ස්ටයිනර්ගේ තර්කයෙහි කේන්ද්‍රීය තේමාව විය. ගුඪවාදී සමපේක්ෂනය හා විද්‍යාව අතර අවිච්ඡින්නතාව අවධාරනය කිරීමට ඔහු කලින් දැරූ උත්සාහයකට මුලුමනින්ම සමාන ආකාරයකට, මනෝරාජික චින්තනයේ කූටප්‍රාප්තිය හා අඛන්ඩතාව ලෙස ස්ටයිනර් මාක්ස්වාදය ගෙනහැර දැක්වීය. ස්ටයිනර්ගේ වෘත්තාන්තය අසමානවූ හා විසංවාදී සමාජ ව්‍යාපාර, දේශපාලන ප්‍රවනතා හා න්‍යායික සංකල්ප අත්තනෝමතික ලෙස එකට එකතු කලේය.

> ...ඒ අනුව, 1830 සිට 1848 වසර දක්වා කාලය, දැවැන්ත බුද්ධිමය හා දේශපාලන කැලඹීම් සහිත අවධියක් විය. එම වාතාවරනය නොතිබෙන්නට එංගලන්තයේ චාටිස්ට් ව්‍යාපාරයේ, එක්සත් ජනපදයේ මනෝරාජික ප්‍රජාවන්හි, ජර්මනියේ වාම හේගල්වාදීන්ගේ හා ප්‍රන්සයේ රැඩිකල් කම්කරු පන්ති ව්‍යාපාරයේ නැඟීම ඇති නොවන්නට ඉඩ තිබුනි. *මෙහි කූටප්‍රාප්තිය 1848 වසරේ විප්ලවය හා කොමියුනිස්ට් ප්‍රකාශනයයි. එය*

*අවබෝධකරගත හැක්කේ කලින් පැවති මනෝරාජික ව්‍යාපාරයන්හි හා වෙනත් බොහෝ ප්‍රවනතාවන්හි අවුෆිබෙන්* (Aupheben) *ලෙසින් ය.* (අවධාරනය අපේ)

අවසානයේදී මාක්ස්වාදය වනාහි, විප්ලවවාදී අරගලයේ මෙම ඉතිහාසය තුල තීරනාත්මක භූමිකාවක් ඉටුකල යුතෝපියානු චින්තනය ලෙස හඳුන්වාදී තිබෙන දෙයෙහි උරුමක්කාරයා ය. මෙම ඉතිහාසයෙන් පමනක්ම වුවත් පැහැදිලි වනු ඇත්තේ යුතෝපියානුවාදය තව දුරටත් අපට කිසිදු අදාලත්වයක් නැති, අතීතයට අයත් දෙයක් ලෙස බැහැර කල නොහැකි බවයි. *යුතෝපියානුවාදයේ වර්ධනය හා සාක්ෂාත්කරනය වනාහි මාක්ස්වාදය නම් එවිට, යුතෝපියානුවාදය තුල ජීවමාන වන දෙය මාක්ස්වාදී ව්‍යාපාරයට ඉහලින්ම අදාල වන බව පැහැදිලිය.* (අවධාරනය අපේ)

න්‍යායික හරසුන් භාවය පසෙක තැබුව ද, ඉතිහාසය පිලිබඳ මෙම මුලුමනින්ම ව්‍යාජ ඉදිරිපත් කිරීම සමන්විත වන්නේ, කරුනු කාරනා වශයෙන් කිසිදු සැබෑ වටිනාකමක්වත් නැති, වාචාල වචන හරඹයකට වැඩි යමකින් නොවේ. ස්ටයිනර්ගේ ප්‍රියතම සාහිත්‍ය උපක්‍රමය බවට පත්ව ඇති උපාය යොදාගනිමින් "අවුෆිබෙන්" යන හෙගලියානු වදනෙහි පිහිට පතන්නේ, සිය තර්ක වලට ව්‍යාජ දාර්ශනික විධග්ධ බවක් ආරූඪ කිරීමටය. කිසිවෙකුත් සමීප අවධානයක් යොමු නොකරනතාක් කල් ඕනෑම දෙයක් පාහේ තවත් දෙයක "අවුෆිබෙන්" ලෙස ඉදිරිපත් කල හැකිය. "මාක්ස්වාදය මනෝරාජිකවාදයේ සාක්ෂාත්කරනය හා වර්ධනය වන්නේ නම්, මනෝරාජිකවාදය තුල ජීවමාන දෑ මාක්ස්වාදී ව්‍යාපාරයට අතිශයින් අදාල වන බව පැහැදිලිය" යන අවධාරනය ඊලඟට එයි. එසේ වෙතත්, මේ තර්කය පිලිබඳ ගැටලුව නම්, එහි පූර්ව භාගය ව්‍යාජ වීමයි. මාක්ස්වාදය වනාහි "මනෝරාජිකවාදයේ සාක්ෂාත්කරනය හා වර්ධනය" නොව, එහි න්‍යායික, ඓතිහාසික හා දේශපාලනික නිෂේධනය යි.

මනෝරාජිකවාදය වෙනුවෙන් කථාකිරීම මඟින් ස්ටයිනර්ට, දශක තුනකට අධික කාලයක් නව ගුරුකුලයෙන් බැහැරව සිටීමෙන් පසුව, යලිත් ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලයට ඇතුල්වීමේ මඟක් පෑදී තිබේ. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලයේ අනුගාමිකයෙකුවූ රසල් ජැකොබිගේ *The End of Utopia* (මනෝරාජ්‍යයේ අවසානය) නම් කෘතිය ස්ටයිනර්ගේ ඉමහත් පැසසුමට ලක්විය. ලිබරල්වාදයේ අවශ්‍යතාවට අනුව මනෝරාජිකවාදයේ පුනරුක්තියක් ජැකොබි විසින් ප්‍රවර්ධනය කරමින් සිටි බව ස්ටීව් ලෝංග් ගේ 2002 දෙසැම්බර් ලිපියෙහි සටහන් කර තිබුනි. ස්ටයිනර්ගේ පිලිතුර වූයේ "ජැකොබිගේ කෘතියේ 8 වැනි පිටුවෙහි රැඩිකල්වාදී ලිබරල්වාදයේ ආකෘතියකට යලි පනපෙවීමේ සිය අභිලාශය ඔහු නිවේදනය කරන්නේය යන්නයි. මෙහි අර්ථය, ඒ නිසාම කෘතිය තුල ඉන් ඔබ්බට ඔහු කියා ඇති සියල්ල නොසලකා හැරීමට මාක්ස්වාදීන් වශයෙන් අපට බලකෙරී ඇතැයි යන්න ද?" යනුවෙනි.

ජැකොබිගේ මනෝරාජික ව්‍යාපෘතිය සඳහා හර්බට් මාකියුස්ගේ *Eros and Civilization* (ඊරෝස් හා ශිෂ්ඨාචාරය) නමැති කෘතියෙන් බොහෝ සෙයින් කරුනු උකහාගෙන ඇති බව ද ලෝංග් පෙන්නුම් කර ඇත. මාකියුස් හා ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය පිලිබඳ මෙය හා තවත් බොහෝ විවේචන ස්ටයිනර් විසින් බැහැර කලේය.

> ... *Eros and Civilization* (ඊරෝස් හා ශිෂ්ඨාචාරය) යන කෘතිය පිලිබඳව කරන ලද සාධනීය සටහන යම් මතවාදී අපරාධයක සාධකයක් වේ ද? ඔබ (ස්ටීව් ලෝංගේ) ඊලඟට ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය පිලිබඳ ලුහුඬු ඉතිහාසයක් සපයයි. ඉන් ඔබ උත්සුක වන්නේ එහි අනුගාමිකයන් දේශපාලන අවස්ථාවාදීන් බවත්, 1960 ගනන්වල ශිෂ්‍ය ව්‍යාපාර අවමංගත කිරීමේ වරදට ඔවුන් වගකිවයුතු බවත් ඔප්පු කිරීමටය. එසේ ද වුවත් ඔබ ඉදිරිපත් කරන ඉතිහාසය, උවමනාවට වඩා සරල කිරීම් මාලාවක් සමඟ සංයෝජනය කරන ලද, ඇතැම් ඓතිහාසික යථාර්තයන්ගේ සාරගර්භ සංයුක්තකරනයකි. එය එලිය විහිදුවනවාට වඩා ව්‍යාකූලත්වය අතිකරන පටලැවිල්ලකි. ඔව් ඇඩෝනෝ හා මාකියුස් යන දෙදෙනාම දේශපාලන අවස්ථාවාදීන් වූහ. 1930 ගනන් වල ෆැසිස්ට්වාදයට එරෙහිව "එක්සත් පෙරමුනක" නාමයෙන් මොස්කව් නඩු විභාග සමඟ මේ දෙදෙන එකඟ වූහ. මෙහි අර්ථය වන්නේ ඉන්පසුව ඔවුන් දෙදෙනා තුල අපට කථාකිරීමට තරම් කිසිවක් නොතිබුනේය යන්න ද?

ඉන් ඉක්බිතිව ස්ටයිනර්, *ඊරෝස් හා ශිෂ්ඨාචාරය* මෙසේ වර්නනා කලේය.

> ...එය මනෝරාජික ජීවයෙන් හෙබි කෘතියකි. එය ෆ්‍රොයිඩ්ගෙන් ලබාගත් ශිෂ්ඨාචාරය පිලිබඳ රැඩිකල් පරීක්ෂාවක් තුලින්, මාක්ස්වාදය පිරිපුන් කිරීමට දරන ලද ප්‍රයත්නයකි. ඒ සමඟම එය, එහි කර්තෘ විසින් ගන්නා ලද තත්වාරක්ෂක නිගමන ප්‍රතික්ෂේප කරයි. මේ කෘතිය එතරම් ජනප්‍රිය වූයේ සමාජයේ රැඩිකල් පරිවර්තනයක සම්භාව්‍යතාව පිලිබඳව ඒ තුල අඩංගු නිගමන හේතුකොට ගෙනය. 1960

ගනන්වල නව වාමාංශික ව්‍යාපාරයට එය එක්තරා අන්දමක ආරම්භක ලියවිල්ලක් විය. මේ කෘතිය පිලිබඳව මම දැන් විශ්ලේෂනයක යෙදීමට අදහස් නොකරමි. කෙසේ වෙතත් එය එකවර බැහැර කල යුතු ලියවිල්ලක් නොවේ.

මාකියුස්ගේ නිර්මානය පිලිබඳව ස්ටයිනර් සමාව අයැදින අන්දමේ ආරක්ෂාවක් ගෙන එයි. ඔහු ලෝංග්ට මෙසේ දොස් නගයි.

මාකියුස්ගේ කෘතීන් ගැන කථාකරන විට ඔබ අවධාරනය කරන්නේ ඔහුගේ කෘතිවල කුමන කාල පරිච්ඡේදයට ද යන්න වෙන් කොට හඳුනාගැනීම විශේෂයෙන් වැදගත්ය. *Reason and Revolution* *'හේතුව සහ විප්ලවය'* යන රචනයේ මාකියුස් ද *Eros and Civilization* *'ඊරෝස් හා ශිෂ්ඨාචාරය'* යන රචනයේ මාකියුස් ද *One Dimensional Man* *'එක් මානයක් සහිත මිනිසා'* කෘතියේ මාකියුස් ද එකිනෙකාගෙන් වෙනස්වේ. *'එක් මානයක් සහිත මිනිසා'* යන කෘතිය ලියන අවධිය වන විට විරුද්ධවාදී දේශපාලන භාවිතාවේ යෙදීමට දරන ලද සියලු සම්මත ප්‍රයත්නයන් සංස්කෘත කර්මාන්තය විසින් වලක්වන ලදැයි යන ඉදිරිදර්ශනය මාකියුස් පූර්න වශයෙන් වැලඳගෙන සිටියේ ය. දියුනු පරිභෝජන රටාවක් තුල වර්ධනය කරන ලද අනුයුක්තකරනයේ නව යාන්ත්‍රන ඉදිරියේ විප්ලවකාරී පරිවර්තනය සඳහා වෛෂයික පදනම අදාල නොවේය යන ඉදිරිදර්ශනය ද මාකියුස් පූර්න වශයෙන් වැලඳගෙන සිටියේ ය. කම්කරු පන්තියෙන් ඉවතට හැරීමෙහිලා දැන් සිතාගත නොහැකි තරමේ අනුගතවීම සාධාරනීකරනය සඳහා මේ තකසේරුව උපයෝගී කර ගන්නා ලදී. ඒ සමඟම ශිෂ්‍යයන් හා කොන්කරන ලද සුලුතරයන් විසින් ක්‍රියාත්මක කරන ලද සංස්කෘතික පෙරලා දැමීමක දේශපාලනය කෙරේ නැඹුරුවීම සමග ද මෙය අනන්‍ය කෙරුනි. මාකියුස්ගේ මෙම දේශපාලන හැරීම, නව වමට න්‍යායික අමුද්‍රව්‍ය සැපයීය. මුලු පරම්පරාවක්ම වාමාංශික දේශපාලනය කෙරේ කලකිරවීමට ද එමඟින් බීජ වැපිරූ බවට යුක්ති යුක්ත විවේචන එල්ල කොට තිබේ.

එසේ වුව ද *'ඊරෝස් හා ශිෂ්ඨාචාරය'* යන රචනයෙන් දිස්වන මාකියුස් හා *'ඒක මානයක් සහිත මිනිසා'* යන රචනයේ මාකියුස් දරන ස්ථාවරයේ ඇතැම් බීජ හා අපේක්ෂාවන්, මේ කලින් ලියන ලද කෘතියෙහි (1950 ගනන් වල මැද භාගයෙහි මැකාතියානු ඇමරිකාව තුල රචනා කරන ලද) දක්නට ඇත. 1960 ගනන් වල එම කෘතියෙහි නව සංස්කරනයකට ලියන ලද ප්‍රස්ථාවනාවක මේ අපේක්ෂාවන් මාකියුස්ම පෙන්වා දෙයි. ප්‍රස්ථාවනාව ලියන ලද අවධිය වන විට *'ඒක මානයක් සහිත මිනිසා'* යන කෘතියෙහි ඔහු පෙනී සිටි දේශපාලනයට මාකියුස් පූර්න වශයෙන්ම මාරුවී සිටියේය. එසේ වුවත් *'ඊරෝස් හා ශිෂ්ඨාචාරය'* යන කෘතිය තුල සාධනීය පැත්තක් ඇත. දිගු කලක් තිස්සේ නොසලකා හරිනලද විෂයයක් පිලිබඳ ගවේෂනයක් එම කෘතිය තුල දක්නට ලැබේ. එනම් ලිංගික මර්දන විධීන්ගේ සමාජයීය ස්වරූපය හා පාලක පන්තියට සිය ආධිපත්‍යය පවත්වාගෙන යාමට ඇති හැකියාව අතර සම්බන්ධතාවයි. විප්ලවවාදී පරිවර්තනයක නියෝජිතයෙකු වශයෙන් කම්කරු පන්තියේ ක්‍රියාකලාපය පිලිබඳ මතිය අතහැර දැමීමට තරම් වන කිසිවක් *'ඊරෝස් හා ශිෂ්ඨාචාරය'* කෘතියේ ප්‍රධාන තර්කය තුල නැත. අනිශ්චිත ලෙස නිර්වචනය කරන ලද සංස්කෘතික භාවිතයක් වෙනුවෙන් දේශපාලන අරගලය අතහැරීම සඳහා අපට බලකිරීමක් ද නැත. එසේ වුවත් අති මූලික සංස්කෘතික හා මනෝවිද්‍යාත්මක ගැටලු නොඅමතන දේශපාලන අරගලයක්, අවසාන වශයෙන් පල රහිත වන බව මාකියුස් අවධාරනය කරයි. *Mass Psychology of Fascism* (ෆැසිස්ට්වාදයේ ජනතා මනෝවිද්‍යාව) යන කෘතිය තුලින් විල්හෙල්ම් රයිට් පෙන්වාදුන් කරුන, සාරභූත වශයෙන් ඔහු ද අවධාරනය කරයි. එනම් යටපත් කරන ලද කාමුකත්වයේ තල්ලුව ප්‍රගතිශීලී දිශානතියක් කරා යොමු කිරීමට මාක්ස්වාදී ව්‍යාපාරය මඟක් සොයා නොගත හොත්, අප ම්ලේච්ඡත්වයේ යුගයකට ඇද දැමීම සඳහා ෆැසිස්ට්වාදය එම තල්ලුව ම උපයෝගී කර ගනු ඇත. මේ විෂය සම්බන්ධයෙන් මීට වඩා බොහෝ දෑ මට කිව හැකිය. එනමුදු මම මගේ මතය දැනටමත් තහවුරු කර ඇතැයි සිතමි. මාකියුස් වැනි සංකීර්න චින්තකයෙකු ගැන සාකච්ඡා කරන විට ඔබ සිදුකර ඇති ආකාරයට ඔහුගේ චින්තාව ලඝුකොට දැක්වීම එතරම් ප්‍රයෝජනවත් නොවේ.

තමා වෙනුවෙන් දීර්ඝ ලෙස කරුනු දැක්වීමට මම ස්ටයිනර්ට ඉඩදී ඇත්තෙමි. ස්ටයිනර් එයට පටහැනිව කරුනු දක්වා තිබියදී වුවත්, මාකියුස් විසින් දශක ගනනාවක් තිස්සේ ඉදිරිපත් කරන ලද න්‍යායික සංකල්ප තුල, කම්කරු පන්තියේ විප්ලවකාරී භූමිකාව ප්‍රතික්ෂේප කිරීම කාවැද්දී තිබේ. මාකියුස් පිලිබඳ ස්ටයිනර්ගේ ක්ෂමාලාපය ලිවිය හැකිව තිබුනේ

හතරවන ජාත්‍යන්තරයේ න්‍යායික හා දේශපාලන සම්ප්‍රදායන් තුල තව දුරටත් ක්‍රියාත්මක නොවන්නේ යයි සලකාගත් පුද්ගලයෙකු විසින් පමනි.

### Xi ස්ටයිනර්ගේ නව දේශපාලන සබඳතා

මේ අවධියේදී ම ස්ටයිනර්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව වෙත එල්ල කල ප්‍රහාර කිසිවක සඳහන් නොකල නව දේශපාලන සබඳතා ගොඩනඟමින් සිටියේය. පැහැදිලිව ම ඔහුගේ අභිප්‍රාය වී තිබුනේ සිය වර්තමාන දේශපාලන සබඳතා තම ලියවිලි කියවන පාඨකයන්ගෙන් වසං කිරීමයි. New SPACE (නිව් ස්පේස්) යනුවෙන් ද හඳුන්වනු ලබන The New School for Pluralistic Anti-Capitalist Education බහුත්වවාදී ධනේශ්වර විරෝධී අධ්‍යාපනය සඳහාවූ පාසැලෙහි දර්ශනවාදය පිලිබඳ දේශකයෙකු වශයෙන් ස්ටයිනර් පත්වීමක් ලැබීය. සිය පොත්පත් හා පත්‍රිකා ආදිය තුලින් නිව් ස්පේස් පාසැල තමන්ව හඳුන්වාගෙන තිබුනේ "අරාජකවාදීන්, මානවවාදී මාක්ස්වාදීන් හා වෙනත් අය" එකට එකතු කරන "අධිපතිවාදයට අචල ලෙස විරෝධය දක්වන, කට්ටිවාදී නොවන සංවිධානයක්" ලෙසය. වඩාත් නිශ්චිතව කිව හොත් එය, ට්‍රොට්ස්කිවාදයට සතුරුවූ මධ්‍යම පන්තික රැඩිකල් ප්‍රවනතාවන් ගෙන් සමන්විතවූ එකතුවකි. එහි "ගුරුවරු, කථිකයන් හා සංවිධායකයින්" අතර කෙවින් ඇන්ඩර්සන් (මොහුගේ ලියවිලි ස්ටයිනර්ගේ දැඩි ප්‍රශංසාවට ලක්ව ඇත.) ස්ටැන්ලි ඇරොනොවිට්ස්, එරික් බ්‍රොනර් හා බර්ටල් ඔල්මාන් වැනි ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයට සමීප සබඳතා ඇති පුද්ගලයෝ සිටිති. හරිත පක්ෂයේ හා සුලු ධනපති විරෝධතා දේශපාලනයට සම්බන්ධ අනෙකුත් වර්ගයන්ගේ ක්‍රියාකාරී පුද්ගලයන් ද එහි ඇදුරු මඬුල්ලට අයත්වේ.

නිව් ස්පේස්හි වෙබ් අඩවියේ පලකරන ලද සිය ජීවන තොරතුරු පිලිබඳ විස්තර සටහනෙහි ට්‍රොට්ස්කිවාදීන් සමඟ තමාගේ අතීත සබඳකම් ගැන ස්ටයිනර් කිසිදු සඳහනක් නොකරයි. තම කෙටි චරිතාපදානයෙහි ඔහු සඳහන් කරන එකම දේශපාලන සබඳතාවය වන්නේ 1970 වසරේදී නව පාසැල, ශිෂ්‍යයන් විසින් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය තුල සිය සහභාගිත්වයයි. තමා විසින් පලකල කෘතියක් ලෙස ,*The Case of Martin Heidegger*, "මාටින් හෙයිඩෙගර් පිලිබඳ කාරනය" උපුටා දැක්වුව ද, එය *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි පලවුන* බවක් ඔහු සඳහන් නොකරයි. මෙය පැහැදිලි කරන්නේ කෙසේ ද? මෙයට සම්බන්ධ පෞද්ගලික හෝ දේශපාලන ආරක්ෂාව පිලිබඳ ගැටලුවක් නොමැත. සැබෑ කාරනය නම් මේ කවයන් තුල, ට්‍රොට්ස්කිවාදය හා සම්භාව්‍ය මාක්ස්වාදය සමඟ සබඳතාවය දේශපාලනිකව හා බුද්ධිමය වශයෙන් ගෞරවාන්විත නොවීමයි. තමා "මධ්‍යම පන්තික නිව්යෝර්ක් සංස්කෘතියෙහි කොටසක් බව" සිය ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමින් 1999 දී එවන ලද ලිපිය මගින් ස්ටයිනර් පිලිගත්තේය. ඔහු අද දින දක්වාම එම නරුම හා තමන් තුලම ගැලී සිටින සංස්කෘතියේ කොටසකි. අන් සියල්ලටම වඩා ඔහු විසින් ජාත්‍යන්තර කමිටුව වෙත එල්ල කරන ප්‍රහාරය මෙතරම් කුහක හා දෙපිටකාට්ටු ස්වභාවයක් ගෙන ඇත්තේ මේ කාරනා හේතුකොට ගෙනය. **(63)**

ස්ටයිනර්ගේ විකාශනයේ නානාවිධ අදියර මේ තුල සවිස්තරාත්මකව සමාලෝචනය කර ඇත. සිය ස්ථාවරය මූලික වශයෙන් වෙනස්කර ඇත්තේ ජාත්‍යන්තර කමිටුව විසින් නොව ඇලෙක්ස් ස්ටයිනර් විසින්ම ය. ස්ටයිනර්ගේ බුද්ධිමය චරිතාපදානයේ මෙම විශ්ලේෂනය අවසන් කිරීම සඳහා ඔහු ජාත්‍යන්තර කමිටුවේ ද දැන් ප්‍රත්‍යක්ෂ වන පරිදි පුද්ගලිකව මාගේ ද විවෘත හා හිත් රිදුනු සතුරෙකු වශයෙන් විකාශනය වීමට අදාල වෛෂයික සන්දර්භය සලකා බැලීම අවශ්‍ය කෙරෙයි.

ස්ටයිනර්ගේ සමස්ත දේශපාලන වෘත්තීය ප්‍රගමනය සලකුනුවී ඇත්තේ උච්ඡ ආත්මීය සංචලනයකින් හා අස්ථායිතාවයකින් ය. රැඩිකල් බුද්ධිමතුන් අතර මෙය අසාමාන්‍ය ගති ලක්ෂනයක් නොවේ. සිය වැඩිහිටි ජීවිත කාලයම ගතකර ඇති නිව් යෝර්ක්හි සුලු ධනපති පරිසරය තුල පවත්නා දෘෂ්ටියට අනුගත වෙත්ම, දේශපාලන තත්ත්වයේ හදිසි වෙනස්කම්, ඔහුගේ ආත්මීය දුබලකම් උග්‍ර කිරීමට තුඩු දුන්නේය. සැප්තැම්බර් 11 හා ඉන් ඉක්බිත්තෙහි සිදුවීම්, ස්ටයිනර්ගේ දේශපාලන සමබරතාවය කුඩු පට්ටම් කිරීමෙහිලා ප්‍රධාන භූමිකාවක් ඉටුකලේ යයි සැක කිරීම අසාධාරන නොවේ. පෞද්ගලික හා දේශපාලන ආත්ම භංගයට ස්ටයිනර් තුල ඇති නැමියාව, 1970 ගනන් වලදී අපි අත්දැක ඇත්තෙමු. ලෝක වෙලඳ මධ්‍යස්ථානය විනාශ කිරීම තුලින් ජනිත කරන ලද දේශපාලන ව්‍යාකූලත්වයේ දිය සුලිය තුල මෙය නැවත වරක් ක්‍රියාත්මක විය.

මෙය පෞද්ගලික ප්‍රපංචයක් නොවේ. එය සමාජ ප්‍රපංචයකි. සැප්තැම්බර් 11 න් ඉක්බිත්තෙහි විද්වත් ප්‍රජාවේ බොහෝ කොටස් සිය දේශපාලන හා බුද්ධිමය සමතුලිතතාවය අහිමිකර ගත්හ. ජර්මානු විඥානවාදී දර්ශනවාදී ක්ෂේත්‍රයේ විශේෂඥ විද්වතෙකු වන ටොම් රොක්මෝර් විසින් මේ මංමුලාව කැටි කොට දක්වා තිබේ. ඔහු මෙසේ ලිවීය.

> සැප්තැම්බර් සිද්ධීන් මඟින් ඕනෑම විටෙක සූදානම්ව ඇති අපගේ සංකල්පමය සහතික ව්‍යාකූල කර ඇත. අපගේ න්‍යාය තුලින් අප ලෝකය ග්‍රහනය කරගෙන ඇතැයි යන උපකල්පනය ලෝකය විසින්ම ඇන හිටුවා තිබේ. කිසිවෙකුටත් පෙරදැක ගත නොහැකි අයුරින් ලෝකය වෙනස්වී ඇත. සුපුරුදු

මෙවලම් සරල ලෙස යොදාගනිමින් සැප්තැම්බර් 11 සිද්ධීන් විනිශ්චය කල නොහැකිය. ඒවා පැහැදිලි පිලිවෙලක් පිලිබඳ අපගේ සංවේදනයන්ට බාධා පමුනුවයි. අපගේ පදාර්ථ යලි වතාවක් ගැලපෙනු ඇතැයි අපට කිව නොහැක. **(64)**

රැඩිකල් බුද්ධිමතුන් අතර මෙවැනි වැඳ වැටීම් ගැන ට්‍රොට්ස්කි හොඳින් දැන සිටියේය. "ප්‍රබල සිදුවීම් හමුවේ ඔවුන් පහසුවෙන්ම මංමුලාවී නැවත වරක් සුපුරුදු සුලු ධනපති චින්තන විධික්‍රමවල එල්බ ගනිති." **(65)** 1939 දී ඔහු එසේ ලිවීය. ඇලෙක්ස් ස්ටයිනර්ට අත්වූයේ ද එවන් ඉරනමකි.

බලන්න: ඩේවිඩ් නෝර්ත්: *මාක්ස්වාදය ඉතිහාසය සහ සමාජවාදී විඥ්ඥානය* (කම්කරු මාවත ප්‍රකාශන)

**සටහන්:**

**(47)** මේ රචනය ස්ටයිනර්-බ්‍රෙනර් වෙබ් අඩවියෙහි හමුවූයේ නැත.

**(48)** යේට්ස් මෙසේ තර්ක කලාය.

..බෲනෝගේ දර්ශනය ඔහු ඇදහූ ආගමෙන් වෙන් කල නොහැක. මේ අපරිමිත විශ්වයෙහි ව්‍යාප්තවූ ස්වරූපය තුල ඔහු සිය ආගම - "ලෝකයේම ආගම" - දිටීය. අප්‍රමාන ලෝක ඔහු දුටුවේ ව්‍යාප්තවූ ඥානය ලෙසය. "අවශේෂයන්ගෙන්" ගත් දේවත්වයෙහි නව හෙලිදරව්වක් ලෙස කොපර්නිකානුවාදය සංකේතවත් විය. මෙහි අරුත වූයේ ඊජිප්තුවන්ගේ ප්‍රාකෘතික ආගම හා එහි ඉන්ද්‍රජාලය වෙත ආපසු යාමකි. එසේ වූයේ ඔහු කතෝලික ආකෘතියක් යයි අපූර්ව ලෙස උපකල්පනය කල රාමුවක ය.

මේ අනුව බෲනෝ දාර්ශනික චින්තකයෙකු වශයෙන් වධ හිංසාවට ලක්වීයයි ද අප්‍රමාන ලෝක හෝ පෘතුවි ග්‍රහයාගේ චලනය පිලිබඳ ඔහුගේ අභියෝගාත්මක දෘෂ්ටීන් හේතුකොටගෙන ඔහු පුලුස්සා දමන ලද්දේයයි ද යන වෘත්තාන්තය තව දුරටත් සත්‍ය ලෙස පිලිගත නොහැකිය. පූර්න වශයෙන්ම පුරාතන රසායන විද්‍යාවාදය සමග බැඳී සිටි බෲනෝට ස්වභාව ධර්මයේ, සංඛ්‍යාවේ, ජ්‍යාමිතියේ දල රූප සටහනට අදාල දර්ශනවාදයක්, ඒවාට දිව්‍යමය අර්ථයක් කාවැද්දීමෙන් තොරව පරිකල්පනය කිරීමට නොහැකි විය. මේ අනුව ඔහු දේවත්වයෙන් වෙන්වූ දර්ශනවාදයක නියෝජිතයෙකු ලෙස කිසිසේත්ම සැලකිය නොහැක. [*Giordano Bruno and the Hermetic Tradition,* ගියෝර්දානෝ බෲනෝ හා ආදි රසායන විද්‍යාවාදී සම්ප්‍රදාය (ලංඩන්, රූට්ලේජ් හා කීගන් පෝල් 1964) 355-56 පිටු)]

**(49)** බෲනෝ මරා දැමීමට හේතු වශයෙන් යේට්ස්ගේ කරුනු දැක්වීම මහාචාර්ය මොරිස් ඒ ෆිනෝඩියාරෝ විසින් නිෂ්ප්‍රභා කර ඇත. බෲනෝගේ නඩු විභාගය පිලිබඳව සැලකිලිමත් විශ්ලේෂනයක් මත පදනම් වන ඔහු කෙලින්ම කියා සිටින්නේ "යේට්ස්ගේ අර්ථකථනය සාවද්‍ය" බවයි. බෲනෝගේ නඩු විභාගය පිලිබඳ සිය විස්තරය "වඩාත් පුලුල් ගැටලුවක සන්දර්භයෙහි" තබමින් ෆිනෝඩියාරෝ මෙසේ ලියයි. "ගැලීලියෝගේ නඩු විභාගය විද්‍යාව හා ආගම අතර ගැටුමෙහි ප්‍රතිමූර්තිය වන්නේ නම්, බෲනෝගේ නඩු විභාගය දර්ශනවාදය හා ආගම අතර ගැටුමෙහි ප්‍රතිමූර්තිය වන්නේ යයි කිව හැක. ("Philosophy versus Religion and Science versus Religion," *"දර්ශනවාදයට එරෙහිව ආගම හා විද්‍යාවට එරෙහිව ආගම"* මොරිස් ඒ ෆිනෝඩියාරෝ විසිනි. *ගියෝර්දානෝ බෲනෝ* නම් කෘතියෙහි හිලරි ගැට් විසින් සංස්කරනය කරන ලද (බර්ලින්ටන්, වීටී, ඇෂ්ගේට්, 2002) 54 වැනි පිටුව)

යේට්ස්ගේ ශාස්ත්‍රාලිකය පිලිබඳ හෙලිදරව්කාරී අගැයීමක්, *The Journal of Modern History* නූතන ඉතිහාසය පිලිබඳ සඟරාවෙහි බ්‍රයන් විකර්ස් විසින් රචිත *Frances Yates and the Writing of History* "ෆ්‍රාන්සස් යේට්ස් හා ඉතිහාසය ලිවීම" යන ලිපියෙහි දැකිය හැක. (51 වැනි වෙලුම, අංක 2, 1979 ජූනි, පිටු 287-315) විද්‍යාව පිලිබඳ ප්‍රකට ඉතිහාසඥයෙකු වන විකර්ස්, රොසික්‍රෑසියන්වාදී ප්‍රබුද්ධත්වය පිලිබඳ යේට්ස්ගේ අධ්‍යයනය වෙත අවධානය යොමු කරයි. බෲනෝ පිලිබඳව ඇය විසින් කලින් ලියන ලද කෘතිය අනුව යමින් කල මෙම අධ්‍යයනය, පුනරුද ගුප්තවාදය, බේකන්, ඩේකාර්ට්, කෙප්ලර් හා නිව්ටන් යන අයට අනුප්‍රානය ගෙනදුන් දැවැන්ත බුද්ධිමය ව්‍යාපාරයක් ලෙස හුවා දක්වයි. විකර්ස් මෙවන් සටහනක් තබයි.

බැරෑරුම් ඓතිහාසික අධ්‍යයනයක් ලෙස ඇගේ (යේට්ස්ගේ) කෘතිය වෙත ප්‍රවේශ වන පාඨකයා ඒ තුල ඇති හුදු සමපේක්ෂනයෙන් ද රොසික්‍රෑසියානු ව්‍යාපාරය නිර්වචනය කිරීමේදී යොදාගෙන ඇති අවිවේචනාත්මක ක්‍රම තුලින් ද එහි බලපෑම පිලිබඳව ඇති ව්‍යාකූල කියමන් මගින් ද කරදරයට පත්වනු ඇත. බොහොමයක් තැන්වලදී තර්කය මුලුමනින්ම අතුරුදහන් වේ. නැවත නැවතත් කියවෙන සමහර වදන් අතර, "යම්හෙයකින්" "විය හැක" "ඇතැම් විට" "ඉඩ ඇත" "ඇත්තටම" "වන්නට ඇත" වේ. මේ අනු පිලිවෙල අවසන් වන්නේ "විය" යන නිශ්චිත ස්වරූපයෙනි. (301-02 පිටු)

තම ලියවිලි වලට විෂයවූ පුනරුද ගුප්තවාදීන්ගේ කියමන් හා නිගමන තමන් ද පිලිගන්නා බවට යේට්ස්

පාඨකයන් තුල උපස්ථිතියක් ඇති කරන කොටස් බොහොමයක් එම කෘතිය තුල ඇති බව විකර්ස් පෙන්වා දෙයි.

සැබවින්ම තම විවේචනාත්මක අංශ යේට්ස් විසින් යටපත් කර ඇති බවක් පෙනී යයි. පිලිගත හැකි පරිදිම ඇය සාකච්ඡා කරන්නේ ගුප්ත දෑ පිලිබඳවය. ඒ ක්‍රියාමාර්ගයේ සියලු අංග තාර්කික ව්‍යාඛ්‍යානයකට පාත්‍ර නොවේ. එවැනි දැයට ඉඩ හැරීමෙන් පසුව වුව ද ගුප්ත ක්‍රමවේද හා අරමුනු පිලිබඳව කිසිදු සැකයකින් තොරවූ කොටස් කෘතිය තුල ඇත. එබැවින් මේ තලයේදී පවා අගැයීමේ සාමාන්‍ය ක්‍රියාවලීන් තාවකාලිකව අත්හිටුවා ඇති බවට පාඨකයා තුල කනස්සල්ල දැල්වීම අනිවාර්යයෙන්ම සිදුවනු ඇත.

රොසික්‍රෑසියානු ප්‍රබුද්ධත්වය පිලිබඳ යේට්ස්ගේ අධ්‍යයනය - හා විශේෂයෙන් බේකන්ගේ *New Atlantis* (නිව් ඇට්ලාන්ටිස්) නමැති කෘතිය රොසික්‍රෑසියානු නිර්මානයකැයි යන ඇගේ නිගමනය - ව්‍යාජ එකකැයි සවිස්තරාත්මකව හෙලිදරව් කිරීමෙන් අනතුරුව ඇගේ බුද්ධිමය උරුමය සම්බන්ධයෙන් අසාමාන්‍ය ලෙස කර්කෂ අගැයීමක් මහාචාර්ය විකර්ස් ඉදිරිපත් කලේය.

මෙහිදී මට වාර්තා කිරීමට පමනක් හැකිවන අවසන් පුලුල් ගැටලුව නම්, මේ අවධිය තුල විද්‍යාවේ ඉතිහාසය යලි ලිවීම කෙරෙහි යේට්ස් දැක්වූ උනන්දුවයි. ඔහුගේ සාරභූත 'ආගමික ආකල්ප' සමග වෙලුනු 'ආදි රසායනවිද්‍යාවාදී කූ_මන්ත්‍රනකාරී සම්ප්‍රදායේ' පුනර්ජීවනයට මුල්වූ ඊනියා මන්ත්‍රකරුවා, 'ඇත්ත වශයෙන්ම ලෝකය මත ක්‍රියාත්මකවූ' බව තමන්ගේ *ගියෝර්දානෝ බෲනෝ හා ආදි රසායනවිද්‍යාවාදී සම්ප්‍රදාය'* තුලින් ඇය කියා පෑවාය. එමගින් ලෝකය වෙත නව හැරී බැලීමක් නිර්මානය කෙරුනු අතර එය ප්‍රාථමිකවම විද්‍යාව කෙරේ බලපෑවේය. ඇයගේ මැතම කෘතිය පල කිරීමට පෙරාතුව, චාල්ස් ට්‍රින්කවුස් හා මේරි හෙසී විසින් ඇයගේ තර්ක බැරෑරුම් ලෙස ප්‍රශ්නයට බඳුන් කෙරුනි. මේ ප්‍රබුද්ධයන් දෙදෙනාම ගැන යේට්ස් නොදැන සිටින්නට ඉඩක් නැත. එසේ වුව ද දැන් ඈ ලියන්නේ ඇගේ "විශ්වාසය" 'චින්තනයේ ඉතිහාසඥයින් විසින් සැබවින්ම පුලුල් වශයෙන් පිලිගෙන ඇතැයි' කියාය. (226 වැනි පිටුව) ඇගේ නව ග්‍රන්ථය පුරාම දිවයන වැඩිදියුනු විවාදශීලී ශක්තියකින් යුක්තව ඈ මේ ප්‍රවාදය වෙත ආපසු හැරී සිටියි. 'ඊනියා විද්‍යාත්මක විප්ලවය' පිලිබඳව ඇය කථා කරන්නේ මඳ වශයෙනි. (xi වන පරිච්ඡේදයේ 220 වන පිටුව) නවීන විද්‍යාව ඉන්ද්‍රජාලයෙන් ඉස්මතුවූ බව ඇය කියා සිටියි. ඇයට අනුව රොසික්‍රෑසියානුවාදය විශේෂයෙන්ම එහි වැදගත් අවස්ථාවකි. සැබවින්ම එය තී ර න ා ත් ම ක අවධියකි. පුනරුදයෙන් ඉවත්ව 17 වන සියවස කරා ගමන්කිරීමේදී එය එක් තීරනාත්මක පියවරකි. (117 පිටුව) 'රොසික්‍රෑසියානු ව්‍යාපාරයේ සිට රෝයල් සොසයිටි හෙවත් රාජකීය සමාජය දක්වා දිවෙන සම්ප්‍රදායේ දම්වැලක් ඈ පසුව සොයා ගනියි. (83 පිටුව)

එම ප්‍රකාශ වලට පදනමක් නැති තරම්ය. පුනරුදයේ ඉතිහාසය නැවත ලිවීමට නැඹුරුවූ යේට්ස්ගේ ව්‍යාපෘතිය ගල් හෝ වැලි මත නොව වාතය මත ගොඩනැගුනු මනස්කල්පිතයකි. (315-16 පිටු)

"අවසාන වශයෙන් (රොසික්‍රෑසියානු ප්‍රබුද්ධත්වයේ) ක්‍රමවේදය පිලිගන්නේ නම් හෝ අනුකරනය සඳහා ආකෘතියක් වශයෙන් උපයෝගී කර ගන්නේ නම් එහි ප්‍රතිපල ව්‍යසනකාරී වීමට ඉඩ ඇතැයි" විකර්ස් අනතුරු ඇඟවීය. (316 පිටුව)

අවසානාවකට මෙන් විකර්ස් අනතුරු ඇඟවූ පරිදිම කටයුතු සිදුව තිබේ. යේට්ස්ගේ ශාස්ත්‍රෝද්ග්‍රහනය පශ්චාත් නූතනවාදී යුගයට පූර්වයෙන් සිදුවූවක් වුව ද ඇගේ ප්‍රවාදයන්හි භෞතිකවාදී විරෝධී දිශානතිය හා කලින් නොසලකා හරින ලද " ප්‍රජාවන්" හා "වරප්‍රසාද නොලත් දේශන" (ගුප්තවාදය, ඉන්ද්‍රජාලය) ඇය විසින් යලි හෙලිදරව් කිරීමෙන් ජනිතවූ "ප්‍රබෝධය" 1980 ගනන්වල හා 1990 ගනන්වල ක්‍රියාශීලී වූ ශාස්ත්‍රාලිකයන්ට "විද්‍යාත්මක ක්‍රමවේදයේ" සම්ප්‍රදායික සංකල්පය දිස්වූයේ කිසිදු සාර්වත්‍රික වලංගුභාවයකින් තොර නිශ්චිත සංස්කෘතික පරිසරයක නිමැවුමක් ලෙසය. පශ්චාත් නූතනවාදී ශාස්ත්‍රෝද්ග්‍රහනයට ඇතුලත් වූයේ වෛෂයිකත්වයට ඇතැයි කියනු ලබන ව්‍යාජ ප්‍රකාශ වල බරපතල සංශෝධනයකි. එය ප්‍රගුන කරන එක් අයෙකුට අනුව -

නව ප්‍රවේශයෙහි ප්‍රතිපලයක් වශයෙන් පසුගිය විසි වසර තුල ඉංග්‍රීසි විද්‍යාවේ ඓතිහාසික ක්‍රමලේඛය, දේශන විවරනය කිරීමේ අවශ්‍යතාවයේ දැඩි බලපෑමට හසුව තිබේ. මුලින්ම කථන ක්‍රියාවන් ලෙස දැකගත් විද්‍යාත්මක වියමන්, ඒවායේ සැකසුම් කරුවන්ගේ මෙන්ම ආගමික, දේශපාලන හා ඉන්ද්‍රජාලික පවා වූ ප්‍රබන්ධයන්හි සන්දර්භයන්ට ගැට ගසන ලදී විද්‍යාවේ සන්දර්භීකරනය සමග සිදු වූයේ විද්‍යාඥයා ඓතිහාසිකකරනයට ලක්කිරීමයි. විද්‍යාඥයන්ගේ ඔලුගෙඩි තුල ක්‍රියාත්මක වන ආසක්තයන්, සාරධර්ම හා මතවාද සොයාගැනීමයි. මෙම ඔලුගෙඩි වරෙක සලකන ලද්දේ එවන් ආවේගයන්ගෙන් තොරවූ ඒවා ලෙසය. ඊලඟ පියවර වූයේ ඉතිහාසඥයන් හා විද්‍යාවේ සමාජ විද්‍යාඥයින්, දාර්ශනික සාපේක්ෂතාවාදීන්ගේ විලාසය ආරූඪ කර ගැනීමයි. විද්‍යාව නිරවද්‍ය විය හැකි ද, සාවද්‍ය විය හැකිද යන ගැටලුව සමාන සේ සලකන ලදී. බලය සහ

ආසක්තයන් මත කෙරෙන ප්‍රබන්ධනයේ නිදහස් සංචලනය වෙත අවධානය මාරු විය. එනම්, එකිනෙක හා තරග වදින විද්‍යාත්මක පරමාදර්ශයන්ගේ සාර්ථකත්වය නිගමනය වන්නේ සමාජ යථාර්තයෙන් යයි දැක ගැනීමයි. (Constructing, Deconstructing, and Reconstructing the History of Science, " *විද්‍යාවේ ඉතිහාසය ගොඩනැගීම, විවේචනාත්මක විශ්ලේෂනය හා යලි ගොඩනැගීම"* මාග්‍රට් සී ජේකබ් විසිනි. *The Journal of British Studies* බ්‍රිතාන්‍ය අධ්‍යයන පිලිබඳ ජර්නලය, 36 වන වෙලුම,අංක 4, (1997 ඔක්තෝබර්) 459 පිටුව (අවධාරනය අපේ)

ඉහතින් උපුටා දක්වන ලද කොටසෙහි කතුවරිය වන මාග්‍රට් සී ජේකබ්, යේට්ස්ගේ අනුගාමිකාවකි. යේට්ස් විසින් "බෲනෝ, නව කොපර්නිකානු ධර්මතාවේ තරමක් සිහි විකල්වූ අනුගාමිකයෙකු" ලෙස නිරූපනය කිරීම, ඇයගේ පැසසුමට ලක්වෙයි. විද්‍යාත්මක චින්තනයේ වර්ධනය තුල ආගමේ සාරභූත අනුප්‍රානික භූමිකාව විදහා දැක්වීම සම්බන්ධයෙන් ජේකබ්, යේට්ස්ට පසසයි. "1960 ගනන්වල ෆ්‍රාන්සස් යේට්ස්ගේ කෘතීන් පලවීමට පටන් ගැනීමත් සමග, නූතන යුරෝපයේ මුල් කාලීන ඉතිහාසඥයින්, තමන්ගේ ප්‍රමුඛ පෙලේ ස්වාභාවික දාර්ශනිකයන් බොහෝ දෙනෙකුගේ අභිප්‍රේරන හා ආසක්තයන් විදහා දැක්වූ හේතුවාදී විස්තරවලින්, ඔවුන් මුදාගෙන ඇතැයි" ඇය ලියයි. ( *"යල්පිනූ සිතුවිලිවල චින්තාව, යල්පිනූ ප්‍රශ්න මතු කිරීම"* ඇමරිකානු ඓතිහාසික සමාලෝචනය හෙවත් *The American Historical Review* ද ඇමරිකන් හිස්ටොරිකල් රිවීව් 195 වන වෙලුම, අංක 2 (2000 අප්‍රේල්) 497 පිටුව)

(50) නැසීගිය බෙටී ජෝ ඩොබ්ස්, *Newton and the Culture of Newtonianism* (නිව්ටන් හා නිව්ටන්වාදයේ සංස්කෘතිය) යන කෘතියේ මාග්‍රට් සී ජේකබ් සමග සම කර්තෘත්වය ඉසිලීය. 39 වන අධෝ ලිපියෙන් එය උපුටා දක්වා ඇත.

(51) විලියම් නිව්මන්ගේ සමාලෝචනය, *ෂිසිල* (අයිසිස්) සඟරාව, 84 වෙලුම, අංක 3 (1993 සැප්තැම්බර්) 578 පිටුව

(52) මේ විවාදය සමාලෝචනය කිරීමේදී මහාචාර්ය එච් ෆ්ලෝරිස් කොහේන්, විද්‍යාව පිලිබඳ යේට්ස්ගේ ප්‍රවාදය, විවිධ විභව විශ්වාස පද්ධතීන් අතරින් එකක් ලෙස ද, ඒ සෑම පද්ධතියකටම, එයටම වෙන්වූ තාත්විකත්වයේ ප්‍රමිතීන් ඇති හෝ නැති බව ද යන මතයට මං පෑදීම පිලිබඳ උත්සුකයන් සටහන් කරයි. (*The Scientific Revolution: A Historiographical Inquiry* (විද්‍යාත්මක විප්ලවය- ඓතිහාසික ලේඛන විමර්ෂනයක්) (චිකාගෝ-චිකාගෝ විශ්ව විද්‍යාල මුද්‍රනාලය, 1994-180 පිටුව)

(53) විද්‍යාව අරභයා නිව්ටන් ප්‍රධාන කොටම දායක වූයේ රසායන විද්‍යා ක්ෂේත්‍රයේදී නොව, යාන්ත්‍රික විද්‍යාව, ආලෝක විද්‍යාව හා ගනිතය යන ක්ෂේත්‍රයන්හිදීය. භෞතික විද්‍යාව හා සැසඳීමේදී රසායන විද්‍යාව තවමත් පැවතුනේ ප්‍රාථමික තත්ත්වයකය. රසායන විද්‍යාව එවකට පැවතුනේ ආදි රසායනයෙන් වෙන්කොට හඳුනාගැනීමේ ක්‍රියාවලියක් තුලය. ආදි රසායනයේ ගුඪ පදනම් කෙසේ වුවත්, එය රසායනික ක්‍රියාවලිය පිලිබඳ විවිධ අනුභූතික කරුනු කාරනා එක්රැස් කරගෙන තිබුනි. රසායන විද්‍යාව විද්‍යාවක් ලෙස ගොඩනැංවීමෙහි ලා පලදායී දායකත්වයක් සැපයීමට නිව්ටන් අපොහොසත් වීම කෙරෙහි ඔහුගේ ආගමික දෘෂ්ටීන් කොතෙක් දුරට හේතුවීදැයි පරීක්ෂා කිරීම වඩාත් පලදායී වනු ඇත. ඔහුගේ ආගමික දැක්ම භෞතික විද්‍යාව පිලිබඳ ඔහුගේ කෘතීන්වල ඇතැම් අංශයන් මත බලපෑම් ඇති කලේය. මේ පිලිබඳ ප්‍රකට නිදසුන වන්නේ විශ්වය ප්‍රධානකොටම හැඩගස්වන්නේ දෙවියන් විසින්ය යන ඔහුගේ අභ්‍යුපගමයයි. එසේ වුව ද එයින් පැහැදිලි වන්නේ, නිව්ටන් තමා ජීවත්වූ යුගයේ මිනිසෙකු බව පමනි. භෞතික විද්‍යාව තවදුරටත් වර්ධනය වීම තුලින් මේ සියලු ආගමික සැරසිලි ඉවත් කෙරිනි.

(54) විද්‍යාත්මක විප්ලවය පිලිබඳ යේට්ස්ගේ අර්ථ කථනයෙහි වැදගත් අංශයක් වූ, එමගින් මිනිසාගේ දැනුම හා බලය දැවැන්තව වර්ධනය වීම පමනක් නොව, එම ක්‍රියාවලිය තුල යමක් නැතිවී ගොස් ඇති බවට කෙරෙන සඳහන, අර්ථභාරීය. මේ "යමක්" යන්න මිනිසාගේ ආත්මය තුලට ඇති අන්තර් දෘෂ්ටියට සම්බන්ධය. සවිඥානක හා උප විඥානක යන මට්ටම් දෙක තුලට ද, යහපත් හා දුෂ්ඨ දෑ කිරීමේ හැකියාවන් තුලට ද, අනාවරනය කරන ලද එහි නිර්මානාත්මක ශක්තීන්ගේ රහස තුලට ද ඇති අන්තර් දෘෂ්ටියට සම්බන්ධය. එනමුදු, ඒ සමගම, නූතන විද්‍යාවේ මුල් අදියරෙහි සම්ප්‍රාප්තියත් සමගම, මේ "යමක්" යන්න සඟවන ලද්දක් නොවේනම්, නිශ්චිතවම නොසලකා හරින ලද්දකි.'' (එහිම 181 පිටුව) විද්‍යාව පිලිබඳ මෙම විවේචන ක්‍රියාවලිය, *Dialectic of Enlightenment* (ප්‍රබුද්ධත්වයේ අපෝහකය) නමැති කෘතියෙහි හෝකයිමර් හා ඇඩෝනෝ විසින් ඉදිරිපත් කරන ලද තර්කවලට, නිශ්චිත සමාන කමක් දරයි. මේ කෘතිය, නූතන සමාජයේ අර්බුදය, පාලනය කල යුතු ස්වභාවධර්මයේ විද්‍යාව මත පාදකවූ සංකල්පය කරා ආපස්සට ගමන් කරයි. ඉදිරියේදී අපට දැකගත හැකිවන පරිදි ස්ටයිනර්ගේ දෘෂ්ටීන් මුලුමනින්ම පදනම් වන්නේ හෝකයිමර්-ඇඩෝනෝ විවේචන ක්‍රියාවලිය මතය.

(55) මේ විෂය පිලිබඳව එංගල්ස් මෙසේ ලිවීය.

මධ්‍යකාලීන යුගයේ අන්ධකාර රාත්‍රිය ගෙවීයාමෙන් අනතුරුව, ප්‍රාතිහාර්යයක වේගයෙන් වර්ධනය වන, ඇදහිය නොහැකි ශක්තියකින් යුත් විද්‍යාවන් අලුතෙන් පැන නැංගේ නම්, නැවත වරක් මේ ප්‍රාතිහාර්යයපිලිබඳව අප නයගැති විය යුත්තේ, නිෂ්පාදනයටය. පලමු කොට ම, කුරුස යුද්ධ වලින් පසුව, කර්මාන්ත දැවැන්ත පරිමානයකින් වර්ධනය විය. එතුලින් නව යාන්ත්‍රික, (රෙදි විවීම, ඔර්ලෝසු කර්මාන්තය, ධාන්‍ය ඇඹරීම) රසායනික, (සායම් පෙවීම, ලෝහ විද්‍යාව, මධ්‍යසාර පෙරීම) හා භෞතික (දෘෂ්‍ය කාච, කන්නාඩි) කරුනු දැවැන්ත ප්‍රමානයක් කල එලියට පැමිනියේ ය. එමගින් නිරීක්ෂනය සඳහා අති විශාල කරුනු සම්භාරයක් ලබාදුන්නා පමනක් නොව සම්පරීක්ෂනය සඳහා කලින් පැවතියාට වඩා හාත්පසින්ම වෙනස් මාධ්‍යයන් ද සම්පාදනය කෙරුනි. එතුලින් නව උපකරන නිර්මානය කිරීමට ඉඩ සැලසුනි. සැබවින්ම, ක්‍රමානුකූල සම්පරීක්ෂන විද්‍යාවක් ගොඩනැගීමට දැන් හැකිවී යයි කිව හැක. දෙවනුව, අතීතයෙන් උරුම වුනු ශිෂ්ඨාචාරය හේතුකොටගෙන ඉතාලිය තවමත් මුදුනෙහි සිටිය ද, පෝලන්තය ද ඇතුලු සමස්ත බටහිර හා මධ්‍යම යුරෝපය ම, එකිනෙකට සම්බන්ධවූ රටාවකට අනුව දැන් වර්ධනය විය. තෙවනුව, හුදෙක්ම ධාන්‍ය ලබාගැනීම සඳහා ද, ඒ හේතුව නිසා අවසන් වශයෙන් නිෂ්පාදනය සඳහා ද කරන ලද භූගෝලීය සොයාගැනීම්, කාලගුන විද්‍යාත්මක, සත්ව විද්‍යාත්මක, උද්භිද විද්‍යාත්මක හා කායික විද්‍යාත්මක පෙනුමක් ගත් අනන්ත හා මෙතෙක් අත පෙවීමට නොහැකිව තිබූ ක්ෂේත්‍ර තුලට මඟ විවෘත කලේය. සිව්වැනිව තිබුනේ මුද්‍රන යන්ත්‍රයයි. (*Marx Engels Collected Works,* මාක්ස් එංගල්ස් එකතුකල කෘති, 25 වෙලුම (නිව් යෝර්ක්, ජාත්‍යන්තර ප්‍රකාශකයෝ, 1987, 466 පිටුව)

(56) යේට්ස් මෙසේ ලිව්වා ය.

... බුද්ධිමය ව්‍යාපාරයක් ඇරඹෙන්නේ අධිෂ්ඨානයේ චලනය තුලිනි. උනන්දුව දල්වන නව කේන්ද්‍රයක් පැන නඟී. හැඟීම්බර ප්‍රබෝධයක් ඒ වටා ඇත. මනස, අධිෂ්ඨානය මෙහෙයවන දිහාවට හැරී ගනියි. නව ආකල්ප, නව සොයාගැනීම් ඒ පසුපස පැමිනෙයි. නූතන විද්‍යාවේ ඉස්මතුවීම පිටුපස තිබුනේ ලෝකය ද, එහි විශ්මය දනවන දෑ ද, එහි ගුප්ත කටයුතු ද වෙත අධිෂ්ඨානය මෙහෙයවීමකි. එම කටයුතු අවබෝධකර ගැනීමට ඒවා ක්‍රියාත්මක කිරීමට නව ආශාවක් හා අධිෂ්ඨානයක් ඇතිවිය. (*Giordano Bruno,* ගියෝර්දානෝ බෲනෝ, 448 පිටුව)

විද්‍යාවේ විප්ලවය සඳහා පසුබිම සූදානම් කල සැබෑ ඓතිහාසික, සමාජ-ආර්ථික ක්‍රියාවලීන් අවබෝධකර ගැනීමට දායක වන කිසිවක් ඉහත ඡේදයෙන් ඉදිරිපත්කොට නැත.

(57) ලෙනින්ගේ *Philosophical Notebook* (දාර්ශනික සටහන් පොත්) මේ ආකාරයේ අනිශ්චිත ප්‍රකාශ පිලිබඳ රුදුරු විවරනයන්ගෙන් ගහන ය. "ශුල්යට්කොෆ්ගේ පොත පිලිබඳ සටහන්" යන පරිච්ඡේදය මීට නිදසුනකි. ශුල්යට්කොෆ්ගේ වික්ෂිප්ත සූත්‍රගතකිරීම් කෙරෙහි ලෙනින් නිර්දය ලෙස සිය ප්‍රතිචාරය දක්වා ඇත. මෙය විශේෂයෙන් භෞතිකවාදය හා අනුභූතිවාදය අතර සම්බන්ධය ගැන සාකච්ඡා කරන කොටස්වලට අදාලය. "හරය පිලිබඳ විශ්ලේෂනයකින් තොර බාල පැහැදිලි කිරීමක්" යන්න කැපී පෙනෙන විවේචනයකි. (*Collected Works,* ලෙනින්: එකතුකල කෘති, 38 වෙලුම (මොස්කව්, ප්‍රගති ප්‍රකාශකයෝ, 1973, 500 පිටුව) තව ද, "නොපැකිලව පෙරට යන්න, සියල්ල එක ගොඩට දමන්න, අනුභූතිවාදය හා සංශයවාදය, සියල්ල නිෂ්පාදනයට "සමරූපීවේ" ශුල්යට්කොෆ් සහෝදරයා ලාමකය, අතිශයින්ම ලාමකය" (එහිම 494 පිටුව) "වාචාලයා" හා වඩාත් බහුල ලෙස යෙදුනු "මොන නිෂ්ඵල කියමන් ද" අනෙකුත් නිශේධනාත්මක විවේචනයන්ට ඇතුලත්ය.

(58) සත්‍යයේ සංකල්ප ලඝුකොට දක්වන දර්ශනවාදයන්. සාමාන්‍යයෙන් පහල වන්නේ බුද්ධිමය පිරිහීම හා දූෂනය මුල්බැසගත් අවධීන් තුලය යන්න හේගල්ගේ නිරීක්ෂනය විය.

(59) 1972-79 අතර කාලයේදී බ්‍රෙනර් වර්කර්ස් ලීගයේ සාමාජිකයෙකු විය. 1977 වසරේ ගෝල්ඩ්ස්ටයින් පක්ෂය හැරයාමෙන් අනතුරුව, බ්‍රෙනර් *Bulletin* බුලටින් පත්‍රයේ කර්තෘත්වය දැරීය. 1979 ජනවාරියේ දී ඩෙට්රොයිට් නගරයට යන ලෙස ඔහුට දන්වන ලදී. ඔහු නගරයේ සතියක් පමන රැඳී සිටීමෙන් පසුව හදිසියේම ඉවත්ව ගියේය. වර්කර්ස් ලීගය සමඟ සියලු සබඳකම් අත්හල ඔහු පක්ෂය අතහැර යාම පිලිබඳව කිසිදු පැහැදිලි කිරීමක් නොකලේය. ඉන්පසු වසර 20 ක් යන තෙක්ම මට බ්‍රෙනර් යලිත් හමු නොවීය. 1996 වසරේ ටොරොන්ටෝ නගරයේදී ඉතා කෙටි වේලාවකට අපි හමුවීමු. එය ඔහු සමඟ කරන ලද මාගේ අවසන් හා එකම සාකච්ඡාව විය. සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනීමට ඔහු උනන්දුවක් නොදැක්වීය. ඔහු ලෝක සමාජවාදී වෙබ් අඩවියට ලිපි ගනනාවක් සම්පාදනය කලේය.

(60) 69-114 පිටු බලන්න.

(61) එසේද වුවත්, එ.උ.ා (ස්ටයිනර් වෙබ් අඩවිය) තුල සසප හා ජාත්‍යන්තර කමිටුවේ, යුද්ධය පිලිබඳ ප්‍රතිපත්ති හා වැඩ කටයුතු, ස්ටයිනර් හා බ්‍රෙනර් විසින්

රුදුරු භාෂාවකින් හෙළා දකියි.

(62) ස්ටයිනර් ඕනෑවට එපාවට මෙන් සඳහන් කරන කොමියුනිස්ට් ප්‍රකාශනය, එය පිලිගත් සමාජවාදය හා මනෝරාජිකවාදය අතර ප්‍රභේදය අවධාරනය කලේය.

විවේචක-මනෝරාජික සමාජවාදයේ සහ කොමියුනිස්ට්වාදයේ වැදගත්කම සහ ඓතිහාසික සංවර්ධනය අතර තිබෙනුයේ අපවර්තනීය සම්බන්ධකමකි. සමකාලීන පන්ති අරගලය වර්ධනය වන සහ නියත හැඩයක් ගන්නා ප්‍රමානයට සමානුපාතිකව, අරගලයට ඉහලින් සිට එයින් ඈත්වී, වෙන්වී සිටීමේ මනස් සෘෂ්ටික ප්‍රහාරයන්ගේ මුලු ප්‍රායෝගික වටිනාකම ද, මුලු න්‍යායික සහේතුක නිදොස්භාවය ද නැතිවී යනු ඇත. එමනිසා මේ ක්‍රමයේ නිර්මාතෘවරුන් බොහෝ කරුනු අතින් විප්ලවවාදී වුව ද, ඔවුන්ගේ ගෝලයෝ හැමදාම ප්‍රතිගාමී නිකායවල් සෑදූහ. නිර්ධන පන්තියේ තවත් දුර සංවර්ධනය නොදකින ඔවුහු සිය ගුරුන්ගේ පැරනි මතවල තදින්ම එල්ලී සිටිති. එබැවින් ඔවුහු පන්ති අරගලය අප්‍රානික කිරීමටත් පන්ති ප්‍රතිසතිතාවන් සමාදානයෙන් නිරවුල් කර දැමීමටත් නොකඩවා ක්‍රියා කරති. ඔවුහු තවමත් ස්වකීය මනෝරාජික සමාජයන් අත්හදා බැලීමට සිහින දකිමින් නව ජෙරුසලමේ කුඩා සැලැස්ම වන හුදෙකලා පැලැන්ටිස් පිහිටුවාලීමට ද, (home colonies) අභ්‍යන්තරික ජනපද පිහිටුවාලීමට ද කුඩා "ඉකාරියා"** පිහිටුවාලීමට ද ක්‍රියා කරති. මේ අහස් මාලිගා ඉදිකිරීම පිනිස ධනපතීන්ගේ හදවත් වලට සහ මුදල් පසුම්බි වලට ආයාචනය කිරීමට මොවුනට සිදුවී ඇත. ඉහතින් විස්තර කල ප්‍රතිගාමී හා ගතානුගතික සමාජවාදීන්ගේ ප්‍රවර්ගයට මොවුහු ක්‍රම ක්‍රමයෙන් වැටෙමින් සිටිති. ඔවුන් එම ප්‍රවර්ගයෙන් වෙනස් වන්නේ වඩාත් ක්‍රමානුකූල පන්ඩිතමානීත්වය නිසාත්, තම සමාජ විද්‍යාවේ ආනුභාසම්පන්න ප්‍රතිපල පිලිබඳව ඔවුන් තුල ඇති අන්ධ භක්තිය නිසාත් පමනකි. (මාක්ස් එංගල්ස්-කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය, මොස්කව් ප්‍රගති ප්‍රකාශක මන්දිරය, 1980 (70-71 පිටු)

(63) නිව් ස්පේස් පාසැලෙහි ස්ටයිනර් විසින් පවත්වන ලද විවිධ දේශන මාලාවන් සම්බන්ධයෙන් විශ්ලේෂනයක යෙදීමට මේ අවකාශය තුල හැකියාවක් නැත. හේගල්ගේ "*තර්ක ශාස්ත්‍රය,*" "*ඉතිහාසය තුල හේතුව*" හා හේගල්ගේ "*මනස පිලිබඳ ප්‍රතිවේදය*" ගැන ඔහු පාඨමාලා පවත්වා ඇත. ස්ටයිනර්ගේ දේශන අන්තර් ජාලයෙහි පලකර ඇත. මා අදහස් කරන අන්දමට ඒවා ඉතාමත් දුර්වලය. හේගල් පිලිබඳවත් ඒ හේතුකොටගෙන මාක්ස් පිලිබඳවත් ස්ටයිනර්ගේ විශ්ලේෂනය මාක්ස්වාදී විශ්ලේෂනයකට කිසිම සමාන කමක් දක්වන්නේ නැත. දේශනවල වඩාත් කැපී පෙනෙන අංගය වන්නේ ඒවාට සවන්දෙන කිසිවෙකු, ස්ටයිනර් භෞතිකවාදියෙකු යයි විශ්වාසයක් ඇතිකර නොගැනීමයි. හේගල්ගේ විඥානවාදය පිලිබඳව ප්‍රකටව ඇති විග්‍රහයෙන් ඔහු කැපී පෙනෙන ආකාරයෙන් වෙන්වී ගනියි. "ඉතිහාසය තුල හේතුව" යන විෂය පිලිබඳ දේශනයකදී ඔහු ශිෂ්‍යයන්ට මෙසේ කියා සිටියි. "මේ පාඨමාලාවෙන් අපට හැකි යමක් උකහා ගැනීම සඳහා හේගල් ගැන ද මාක්ස් ගැන ද ඔබ දන්නා සියල්ල අමතක කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. හේගල් පිලිබඳ අවබෝධය හා මේතාක් දුරට මාක්ස් පිලිබඳ අවබෝධය ද විවිධ අර්ථ කථනයන් තුලින් වෙනස් කර ඇත. මේ අර්ථ කථන හේගල්ගේ ව්‍යාපෘතියට හෝ මාක්ස්ගේ ව්‍යාපෘතියට සමාන කමක් නොදක්වයි." ඔහු විවේචනය කරන අර්ථ කථනය නම්, හෙගලියානු අපෝහකය මාක්ස් විසින් යලි සකස් කිරීමේදී විඥානවාදයෙන් බිඳී යාමක් අවශ්‍ය වන්නේ යයි ප්‍රකාශ කෙරෙන අර්ථ කථනයයි. සිය ශිෂ්‍යයන්ට ඔහු මෙසේ කියා සිටියි. "මාක්ස් හේගල්ව ඔලුවෙන් සිටවූ බවක් හෝ දෙපයින් සිටවූ බවක් හෝ මට ඇසීමට අවශ්‍ය නොවේ." ඉන් පසුව, එම දේශන මාලාවෙහිම ස්ටයිනර් මෙසේ කියා සිටියි. "මා අදහස් කරන අන්දමට මාක්ස්ගෙන් පසුව විඥානවාදය හා භෞතිකවාදය යන මතීන් නැවත සලකා බැලිය යුතුය." හේගල්ගේ 'තර්ක ශාස්ත්‍රය' පිලිබඳ ස්ටයිනර්ගේ පලමුවැනි දේශනයෙන් හේගල් අධ්‍යයනය කිරීමේදී මාක්ස්වාදී ප්‍රවේශයෙහි වැදගත්කම ඔහු නිශ්චිත ලෙසම ප්‍රතික්ෂේප කරයි. ඔහු මෙසේ ප්‍රකාශ කලේය.

"මාක්ස්වාදී සම්ප්‍රදාය තුල මෙවන් අර්ථ කථනයක් ඇත. හොඳයි, හේගල් තත්වාරක්ෂකවාදී චින්තකයෙකි. එහෙත් ඔහු ඉටුකල දෙයින් අපට යමක් ඉතුරු කරගත හැකිය. එනම්, අර්ථය කුමක් වුවත්, ඔහුගේ විධික්‍රමයයි. මා හේගල් පිලිබඳව උගන්වන්නේ ඒ ආකාරයට නොවේ. ඒ අතරම එය ඉතාමත්ම අයෝග්‍ය අර්ථ කථනයක්ය යන්න මගේ අදහසයි. මාක්ස්ගේ අදහස ද එය නොවීය."

හෙගලියානුවාදය පිලිබඳ මාක්ස්වාදී විවේචනය සම්බන්ධයෙන් හිතාමතා හා සීමාන්තිකව කරන ලද ග්‍රාම්‍යකරනය උපකාරී වන්නේ, භෞතිකවාදයට එරෙහිව සිය ශිෂ්‍යයන් තුල පූර්ව විනිශ්චයක් ඇතිකිරීමට පමනි.

(64) මාක්ස්වාදයේ ඉතිහාසය පිලිබඳව රොක්මෝර් බොහෝ දුරට ස්ටයිනර්ට සමාන ස්ථාවරයයන් දරන බව සඳහන් කල යුතුය. "මූලික ප්‍රශ්නය" පිලිබඳ ගැටලුවට මෙය විශේෂයෙන් අදාලය. මාක්ස් විඥානවාදියෙකු බව ද භෞතිකවාදී මාක්ස්වාදය බොහෝ සෙයින් එංගල්ස්ගේ සොයාගැනීමක් බව ද ඔහු (රොක්මෝර්) අවධාරනය කරයි. 2003 මැයි මස මම මහාචාර්ය රොක්මෝර්ගේ මත දැඩි විවේචනයට

ලක් කලෙමි. (බලන්න, *හේගල් මාක්ස් එංගල්ස් සහ මාක්ස්වාදයේ සම්භවයන්*, www.wsws.org **සිංහල, 2008 මැයි 29-30)** MWHH (ස්ටයිනර්ගේ වෙබ් අඩවිය) තුලින් ස්ටයිනර් රොක්මෝර්ගේ ආරක්ෂාවට ඉදිරිපත් වෙයි.

(65) *මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා* - කම්කරු මාවත ප්‍රකාශන

සමාප්තයි.